# (ආ) කාර්මික නිෂ්පාදනය

## හැඳින්වීම

කාර්මික නිෂ්පාදන පිළිබඳව පහත දැක්වෙන විශ්ලේෂනය, පදනම් වී ඇත්තේ, පෞද්ගලික සහ පොදු අංශයේ කාර්මික ව්‍යාපාරයන් මගින් සපයනු ලැබූ තොරතුරු මතය. 11 (ආ) 1 වැනි සංඛ්‍යා සටහනින්, මෙම කර්මාන්ත, කාණ්ඩායම් 24 කට කොටස්කර ඇත. XX සිට XXIV දක්වා වූ කොටස්, මුළුමනින්ම නැතහොත් ප්‍රධාන වශයෙන් පොදු අංශයේ කාර්මික ව්‍යාපාරයන් සම්බන්ධවය. පොදු අංශයන්හි නිෂ්පාදන උපනතීන්, වෙන වෙනම මතු දැක්වෙන "පොදු අංශයෙහි කර්මාන්ත" නම් වූ ශීර්ෂය යටතේ විශ්ලේෂණය කෙරෙනු ඇත.

## ප්‍රධාන උපනතීන්

1967 දී රුපියල් දශ ලක්ෂ 103 ක් වූ, කාර්මික නිෂ්පාදනවල වටිනාකමේ වැඩිවීම, 1966 හා සසඳන කළ රුපියල් දශ ලක්ෂ 3·3 කින් වැඩිවූ බව, 11 (ආ) 2 සංඛ්‍යා සටහනේ දැක්වේ. කෙසේ වුවද, එක් වර්ෂයක කර්මාන්තයෙහි වර්ධනය, තවත් වර්ෂයක වර්ධනය හා කරනු ලබන සන්සන්දනය කිරීම්, නොයෙක් අඩුපාඩුකම්වලින් යුක්තය. කාර්මික කටයුතු බොහෝ දුරටම ආනයන කරනු ලබන අමුද්‍රව්‍ය මත රැඳේ. 1967 දී ආනයන කොට සැපයූ අමු ද්‍රව්‍ය ප්‍රමාණය කලින් වර්ෂයේදීට වඩා වැඩිය. මෙයින් වැඩි හරියක් ප්‍රයෝජනයට, ගන්නා ලද්දේ කාර්මික අංශය මගිනි. 1967 වර්ෂයේදී කාර්මික නිෂ්පාදනයේ සඳහන් වී ඇති අගය ඉහළ යාම නිරූපනය කරන්නේ වර්ෂයතුලදී සිදුවූ මිල ඉහළ යාමත් එසේම සමීක්ෂණයෙහිදී වඩාත් යහපත් කාර්මික පිරිමැසීමක් විය හැකිය. 1967 මහ බැංකු සමීක්ෂණයට භාජනය වූ මුළු සමාගම් ගණන 1830 ක් වූ අතර, මෙය, 1966 දී 1394 ක් පමණ වූ සමාගම් ප්‍රමාණය හා සැසඳේ. මේ වර්ෂයේ දී, සමීක්ෂණයේ ක්ෂෙත්‍රය, කාර්මික නිෂ්පාදන පිළිබඳ නව කාණ්ඩ තුනක් (XVI, XVIII සහ XIX) ඇතුලත් කිරීමෙන් පුළුල් කළද, නියමිත වශයෙන් නිෂ්පාදනයෙහි යෙදී සිටින කර්මාන්තයන්හි මුළු නිෂ්පාදනය පිළිබඳව සම්පූර්ණ විස්තරයක් සැපයීමට අපහසු වී ඇත්තේ, පෞද්ගලික අංශයේ සමාගම් 36 ක් පමණ තොරතුරු නොසපයා ඇති බැවිනි.

'**විවිධ ආහාර පිළියෙල කිරීම්**" කාණ්ඩය යටතේ තොරතුරු සැපයූ සමාගම් ගණන 86 සිට 106 දක්වා ඉහළ ගියේය. සියළුම කාර්මික කොටස් අතුරින්, තොරතුරු සැපයුණු සමාගම්වල විශාලම වැඩිවීමක් දක්නට ලැබුනේ දුම්කොළ සමාගම් කොටසෙහි වූ අතර මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ බීඩි නිෂ්පාදනයෙහි යෙදී සිටින කුඩා ඒකකයන් ද සමීක්ෂනයට අඩංගු කිරීමය. **විස්කෝතු සහ කොකෝවා, චොක්ලට් සහ සීනි රස කැවිලි** සාදන කාර්මික කොටසෙහි, විස්තර සැපයූ සමාගම් ගණන එකකින් පහළ ගිය අතර, වාර්තා වී ඇති මුළු නිෂ්පාදන පරිමාව රුපියල් දශ ලක්ෂ 5·3 කින් පහළ වැටුනි. **සිසිල් බීම සහ අංගාර** කළ බීම වගී කොටසෙහි වූ තොරතුරු සැපයූ සමාගම් ගණන අඩු වුවද, ඒවායේ නිෂ්පාදනය ඉහළ ගියේය; 1967 දී 18 ක්වූ සමාගම් ගණන 1966 දී 22 ක්වූ අතර, මෙම වර්ෂයේදී රුපියල් දශ ලක්ෂ 14·5 ක්වූ නිමැවුම් වටිනාකම, 1966 දී රුපියල් දශ ලක්ෂ 11·6 ක් විය.

ගෙතු රෙදිපිළි හා වෙනත් ද්‍රව්‍ය ද, **මසන ලද ඇඳුම් සහ අනිකුත් ආභරණ** ද, ඇතුලත් වූ කාර්මික කොටසෙහි තොරතුරු සැපයූ සමාගම් ගණන 49 කින් ඉහළ ගිය අතර, නිමැවුම් වටිනාකම, රුපියල් දශ ලක්ෂ 56·1 කින් අඩුවී රුපියල් දශ ලක්ෂ 48·1 දක්වා පහළ ගියේය. මෙසේම **විවිධ රසායන නිෂ්පාදිතයන්** කොටසෙහි, මේ වර්ෂයේ තොරතුරු සැපයූ සමාගම් 36 කින් වැඩි වුණත්, ඒවායේ නිමැවුම් වටිනාකම

රුපියල් දශ ලක්ෂ 101·9 සිට රුපියල් දශ ලක්ෂ 98·2 දක්වා පහළ වැටුණි. **නූල් කැපීමේ, රෙදිපිළි විවීමේ සහ නිම කිරීමේ** සමාගම් ගණනද විශාල ලෙස වැඩි වුණත්, මෙම කොටසෙහි නිමැවුම් වටිනාකමෙහි වැඩිවීම වූයේ රුපියල් දශ ලක්ෂ 2·0 ක් පමණි. දක්වා ඇති සංඛ්‍යා විස්තරයට කුඩා ඒකකයන් විශාල ගණනක් ඇතුළත් වන අතර, කර්මාන්තයෙහි මුළු නිපැයුමට ඒවා එකිනෙක සුළු එකතු කිරීම් කරනු ලැබීය. **පාවහන් සහ සම් නිෂ්පාදිත** කොටස, පසුගිය වර්ෂයන්හිදී මෙන් තවදුරටත් පුළුල් විය. 1966 දී තොරතුරු සැපයූ සමාගම් 45 දෙගුණයක් පමණ වී 1967 දී 91 ක්වූ අතර, ඒවායේ වාර්තාවී ඇති නිපැයුම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 4·2 කින් ඉහළ ගියේය. **රබර් නිෂ්පාදිත** (පාවහන් හැර) කොටසෙහි තොරතුරු සැපයූ සමාගම් ගණන 1966 දී පැවති 21 සිට 1967 දී 31 දක්වා ඉහළ යාමත් සමඟම, එහි වාර්තා වී ඇති නිපැවුම් වටිනාකමද රුපියල් දශ ලක්ෂ 18·9 සිට රුපියල් දශ ලක්ෂ 20·7 දක්වා වැඩි විය. තවද, කඩදාසි, **කඩදාසි ද්‍රව්‍ය සහ කාඩ්බෝඩ්** කොටසෙහි නිමැවුමෙහි ද රුපියල් දශ ලක්ෂ 0·9 ක සුළු වැඩිවීමක් තිබූ අතර, තොරතුරු සැපයූ සමාගම් ගණන 24 දක්වා ඉහළ ගියේය. **ලෝහ නිෂ්පාදිත** කොටස ඉහත අවුරුද්දේ වර්ධන අනුපාතිකය පවත්වා ගනු ලැබීය. කර්මාන්තයෙහි විස්තර සැපයූ සමාගම් ගණන 14 කින් වැඩිවූ අතර එහි නිමැවුම් වටිනාකම රුපියල් දශ ලක්ෂ 5·1 කින් ඉහළ ගියේය.

**විදුලි යන්ත්‍ර, උපකරණ, සහ අනෙක් කොටස්** නිමැවුම 1966 පැවති රුපියල් දශ ලක්ෂ 20·8 සිට රුපියල් දශ ලක්ෂ 28·1 දක්වා 1967 දී සැලකිය යුතු අන්දමින් ඉහළ ගියේය. මෙම කොටසෙහි තොරතුරු සැපයූ සමාගම් ගණන 7 කින් වැඩි විය. **වෙනම දක්වා නොමැති** කාර්මික නිෂ්පාදිතයන්ට ප්‍රධාන වශයෙන් ඇතුළත් වූයේ, ප්ලාස්ටික් භාණ්ඩය. මෙහි දී, තොරතුරු සැපයූ සමාගම් ගණන 81 සිට 93 දක්වා වැඩිවූ අතර, නිමැවුම් වටිනාකමෙහි වැඩිවීම රුපියල් දශ ලක්ෂ 1·2 ක් පමණකි. නව කාර්මික කොටස් තුන ද (කලින් ඇතුළත් නොවීය.) මෙයට ඇතුළත්කොට ඇත[1]. (මෙයට පෙර පිරිවැසුමට අයත් නොවූ) එක්ව, මෙහි කාර්මික නිෂ්පාදනය රුපියල් දශ ලක්ෂ 33·6 **ක්** විය, **යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර උපකරණයන් සහ ප්‍රවාහන උපකරණ** සම්බන්ධයෙන් තොරතුරු, සමාගම් 18 ක ගෙන් ලැබුණු අතර, මේවායේ නිපැයුම රුපියල් දශ ලක්ෂ 19·8 ක් විය. **ලී බඩු නිෂ්පාදන** කොටසෙහි තොරතුරු සැපයූ සමාගම් ගණන 13 කි. ඒවා, මුළු නිපැයුමට එකතු කළේ රුපියල් දශ ලක්ෂ 3·6 කි. **ලෝහ නොවූ ඛනිජ නිෂ්පාදිතයන්, ඛනිජ තෙල් සහ අඟුරු නිෂ්පාදිතයන්** නිපැයූ සමාගම් 46 ක නිපැයුම රුපියල් දශ ලක්ෂ 10·2 ක් විය.

**කාර්මික නිමැයුමේ සැකැස්ම**

ප්‍රධාන ආර්ථික භාණ්ඩයන් අනුව, කාර්මික නිෂ්පාදනයෙහි කළ වර්ගීකරණයක් II (ආ) 3 වැනි සංඛ්‍යා සටහනින් දැක්වේ. 1967 දී, මුළු වටිනාකමින් පාරිභෝගික භාණ්ඩ කොටස සියයට 55·4 ක් නිරූපනය කළ අතර, අන්තර් භාණ්ඩ සියයට 31·2 ක් ද, ආයෝජන භාණ්ඩ සියයට 13·4 ක් ද විය. වර්ෂය තුළදී මේ එක් එක් භාණ්ඩයෙහි නිපැයුම් වටිනාකම වැඩි වූ අතර, පාරිභෝගික භාණ්ඩ සියයට 10 කින් ද, අන්තර් භාණ්ඩ සියයට 0·2 කින්ද ආයෝජන භාණ්ඩ සියයට 74 ක් තරම් ප්‍රමාණය කින් ද, ඉහළ ගියේය. මුළු කාර්මික නිෂ්පාදන වටිනාකමෙහි වූ භාණ්ඩ තුනෙහි සාපේක්ෂ තත්ත්වය මෙම වැඩිවීමේ අනුපාතිකයන් මගින් වෙනස් කෙරේ. පාරිභෝගික භාණ්ඩ සහ අන්තර් භාණ්ඩ කොටස පහළ වැටුණ අතර, ආයෝජන භාණ්ඩ කොටස ඉහළ ගියේය.

---

1. මේවා, යන්ත්‍ර සූත්‍ර (විදුලි හැර) සහ ප්‍රවාහන උපකරණ, ලී බඩු නිෂ්පාදන සහ ලෝහ නොවූ ඛනිජ නිෂ්පාදිත යන් සහ ඛනිජ තෙල් සහ අඟුරු නිෂ්පාදිතයන්ද වේ.

## 1964 - 1967 කාර්මික නිෂ්පාදිත හා

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | | | | සේවක සංඛ්‍යාව | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 |
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. .. | 62 | 96 | 86 | 106 | 3520 | 3622 | 3647 | 6301 |
| II. එළවළු, තෙල් සහ මේද .. .. | – | 43 | 44 | 43 | — | 3770 | 3967 | 3940 |
| III. කල් තබාගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු, සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර | 32 | 33 | 26 | 30 | 358 | 453 | 454 | 468 |
| IV. විස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රසකැවිලි .. .. .. | 82 | 65 | 58 | 57 | 2590 | 2927 | 3192 | 3125 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. .. | 33 | 29 | 22 | 18 | 1088 | 1343 | 1257 | 1942 |
| VI. බීර සහ ස්ටවුට .. .. .. | 1 | 1 | 2 | 2 | 300 | 338 | 416 | 431 |
| VII. දුම්කොළ .. .. .. | 23 | 460 | 473 | 566 | 4214 | 8235 | 8905 | 10194 |
| VIII ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | 103 | 110 | 123 | 172 | 6955 | 6341 | 6916 | 6663 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. | – | 66 | 81 | 130 | — | 9650 | 11904 | 10659 |
| X. පාවහන් සහ හම් නිෂ්පාදිත .. .. | 36 | 52 | 45 | 91 | 1990 | 2130 | 2282 | 2730 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. .. | 24 | 27 | 21 | 31 | 1304 | 1435 | 1354 | 2195 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. .. | 96 | 123 | 119 | 154 | 3306 | 4946 | 4704 | 4566 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ් හා කඩදාසි භාණ්ඩ .. | 57 | 60 | 54 | 78 | 2187 | 2347 | 2369 | 2660 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. ., .. | 92 | 98 | 113 | 127 | 2629 | 3365 | 3912 | 4450 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් සහ සැපයුම් .. .. .. | – | 26 | 31 | 38 | — | 1126 | 1212 | 1851<br>1347 |
| XVI. යන්ත්‍ර සූත්‍ර (විදුලිය යන්ත්‍රෝපකරණ හැර) සහ ප්‍රවාහන .. .. .. | — | — | — | 18 | — | — | — | 1582 |
| XVII. සකස්කල නිෂ්පාදිත(වෙනත් තැනක නොසඳහන්) | 69 | 75 | 81 | 93 | 1058 | 1742 | 1717 | 1466 |
| XVIII. දූව නිෂ්පාදිත .. .. .. | – | — | — | 13 | — | — | — | 3043 |
| XIX. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. .. | – | — | — | 46 | — | — | — | 793 |
| XX. පිහන් බඩු .. .. .. | 1 | 1 | 1 | 1 | 300 | 253 | 279 | |
| XXI. තුනී ලෑලි .. .. .. | 1 | 1 | 1 | 1 | 611 | 624 | 744 | 987 |
| XXII. ඛණිජ වැලි .. .. .. | 1 | 1 | 1 | 1 | 105 | 120 | 118 | 314 |
| XXIII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. .. | 1 | 1 | 1 | 1 | 200 | 200 | 250 | 280 |
| XIV. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත .. .. .. | 3 | 13 | 11 | 13 | 1507 | 1868 | 1819 | 1968 |
| එකතුව .. .. .. | 717 | 1381 | 1394 | 1830 | 34222 | 56835 | 61418 | 73955 |

සංඛ්‍යා සටහන II (ආ) 1.

## රැකී රක්ෂා සංඛ්‍යා සංපිණ්ඩනය

| මුළු මිනිස් දවස් (දහස් ගණනින්) | | | | වැටුප් බිල (රුපියල් දශලක්ෂ) | | | | නිෂ්පාදිත වටිනාකම (රුපියල් දශලක්ෂ) | | | | මිනිස් දවසක වැටුප (රුපියල්) | | | | සේවකයෙකුට වැටෙන මිනිස් දවස් | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 |
| 901 | 1070 | 1053 | 1869 | 6·0 | 5·1 | 5·4 | 13·3 | 160·7 | 109·2 | 134·5 | 130·6 | 6·65 | 4·80 | 5·13 | 7·11 | 256 | 295 | 289 | 297 |
| — | 936 | 893 | 887 | — | 4·0 | 4·0 | 3·9 | — | 190·4 | 142·3 | 139·7 | — | 4·29 | 4·36 | 4·40 | — | 269 | 225 | 225 |
| 97 | 120 | 105 | 125 | 0·4 | 0·5 | 0·4 | 0·5 | 3·8 | 5·4 | 5·1 | 6·7 | 4·63 | 4·22 | 4·32 | 4·35 | 271 | 265 | 231 | 272 |
| 693 | 795 | 863 | 802 | 2·6 | 2·9 | 3·2 | 2·9 | 30·9 | 34·9 | 38·6 | 33·3 | 3·78 | 3·65 | 3·67 | 3·59 | 268 | 272 | 270 | 257 |
| 316 | 367 | 294 | 481 | 2·5 | 2·9 | 2·2 | 4·4 | 13·4 | 16·0 | 11·6 | 14·5 | 8·00 | 8·64 | 7·60 | 9·18 | 294 | 273 | 233 | 248 |
| 84 | 92 | 123 | 131 | 0·5 | 0·8 | 1·3 | 1·6 | 2·7 | 7·6 | 5·5 | 5·5 | 5·50 | 8·22 | 10·75 | 12·21 | 280 | 273 | 297 | 304 |
| 1175 | 2141 | 2500 | 2956 | 10·1 | 19·0 | 22·0 | 25·4 | 46·2 | 52·0 | 52·3 | 92·0 | 8·64 | 8·71 | 8·80 | 8·55 | 279 | 260 | 280 | 290 |
| 1749 | 1541 | 1617 | 1539 | 6·9 | 6·4 | 6·4 | 6·4 | 54·9 | 55·5 | 56·1 | 48·1 | 3·93 | 4·15 | 3·93 | 4·16 | 251 | 243 | 234 | 231 |
| — | 2801 | 3259 | 3050 | — | 9·9 | 13·8 | 13·3 | — | 91·3 | 95·1 | 97·1 | — | 3·54 | 4·24 | 4·36 | — | 290 | 274 | 286 |
| 538 | 590 | 628 | 735 | 4·5 | 4·6 | 5·3 | 6·1 | 23·4 | 24·7 | 27·7 | 31·9 | 8·30 | 7·75 | 8·44 | 8·25 | 270 | 277 | 275 | 269 |
| 361 | 396 | 346 | 450 | 1·9 | 2·0 | 1·9 | 3·2 | 17·0 | 19·1 | 18·9 | 20·7 | 5·21 | 5·15 | 5·37 | 7·17 | 277 | 276 | 256 | 205 |
| 884 | 1331 | 1258 | 1118 | 6·4 | 9·4 | 10·0 | 10·9 | 73·7 | 91·2 | 101·9 | 98·2 | 7·21 | 7·08 | 7·92 | 9·75 | 267 | 269 | 267 | 245 |
| 638 | 667 | 674 | 673 | 3·8 | 4·1 | 4·3 | 5·2 | 30·1 | 29·3 | 33·8 | 34·7 | 5·93 | 6·15 | 6·31 | 7·77 | 292 | 284 | 285 | 253 |
| 743 | 926 | 917 | 1099 | 4·1 | 5·2 | 5·0 | 7·8 | 38·5 | 44·7 | 49·0 | 54·1 | 5·52 | 5·57 | 5·42 | 7·10 | 283 | 275 | 234 | 247 |
| — | 263 | 277 | 493 | — | 1·9 | 2·6 | 3·4 | — | 14·0 | 20·8 | 28·1 | — | 7·19 | 9·25 | 6·87 | — | 234 | 229 | 266 |
| — | — | — | 378 | — | — | — | 2·9 | — | — | — | 19·8 | — | — | — | 7·63 | — | — | — | 281 |
| 279 | 415 | 418 | 399 | 1·2 | 1·6 | 1·9 | 1·7 | 11·0 | 14·7 | 16·2 | 17·4 | 4·31 | 3·96 | 4·42 | 4·25 | 264 | 238 | 243 | 252 |
| — | — | — | 182 | — | — | — | 0·7 | — | — | — | 3·6 | — | — | — | 3·78 | — | — | — | 124 |
| — | — | — | 761 | — | — | — | 2·3 | — | — | — | 10·2 | — | — | — | 3·00 | — | — | — | 250 |
| 86 | 71 | 78 | 198 | 0·8 | 0·8 | 0·8 | 2·0 | 2·4 | 2·4 | 2·3 | 4·4 | 8·68 | 11·50 | 10·18 | 10·25 | 288 | 253 | 278 | 280 |
| 171 | 187 | 222 | 276 | 1·3 | 1·8 | 2·0 | 2·4 | 3·9 | 5·2 | 6·5 | 6·8 | 7·70 | 9·48 | 8·91 | 9·00 | 280 | 300 | 298 | 280 |
| 33 | 36 | 36 | 72 | 0·3 | 0·2 | 0·2 | 0·6 | 0·9 | 1·3 | 1·4 | 1·4 | 2·52 | 6·12 | 6·20 | 7·89 | 312 | 300 | 305 | 229 |
| 62 | 65 | 81 | 91 | 0·6 | 0·6 | 0·7 | 0·8 | 1·0 | 1·6 | 1·9 | 1·9 | 3·06 | 8·61 | 8·71 | 8·75 | 310 | 325 | 325 | 325 |
| 470 | 526 | 481 | 550 | 3·5 | 4·9 | 4·0 | 6·3 | 23·0 | 36·5 | 28·8 | 53·5 | 7·33 | 9·29 | 8·39 | 11·40 | 312 | 282 | 264 | 279 |
| 9280 | 15336 | 16123 | 19315 | 57·4 | 88·6 | 97·4 | 128·0 | 537·5 | 847·0 | 850·3 | 954·2 | 6·19 | 5·78 | 6·04 | 6·62 | 271 | 270 | 263 | 261 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

## 1964/67 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම —

| කාර්මික ගණය | වටිනාකම (රුපියල් දශ ලක්ෂ) 1964 | 1965 | 1966 | 1967 |
|---|---|---|---|---|
| **i.** විවිධ ආහාර නිෂ්පාදිත | **160·7** | **109·2** | **134·5** | **130·6** |
| කිරි ආහාර | 4·9 | 13·0 | 15·3 | 14·7 |
| ගව හා කුකුල් ආහාර | 23·5 | 26·4 | 61·1 | 54·2 |
| කපාපු පොල් | 13·2 | 62·2 | 49·7 | 51·1 |
| *ආහාරයට ගන්නා තෙල් හා මේද | 114·4 | — | — | — |
| ලුණු | 0·5 | 1·5 | 5·1 | 6·0 |
| අයිස් | 1·3 | 1·8 | 1·5 | 1·7 |
| අනෙකුත් | 2·9 | 4·3 | 1·8 | 2·9 |
| **ii.** එලවළු තෙල් සහ මේද | — | **190·4** | **142·3** | **139·7** |
| **iii.** කල්තබාගත් සහ ටින්වල අසුරන ලද එලවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනිකුත් ආහාර | **3·8** | **5·4** | **5·1** | **6·7** |
| ජෑම්, ජෙලි, සෝසස් ආදිය | 2·3 | 3·4 | 3·2 | 2·5 |
| අනෙකුත් | 1·5 | 2·0 | 1·9 | 4·2 |
| **iv** බිස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රසකැවිලි | **30·9** | **34·9** | **38 6** | **33·3** |
| බිස්කෝතු | 16·4 | 14·8 | 19·6 | 16·1 |
| සීනි බෝල | 5·5 | 7·6 | 9·6 | 7·5 |
| චොකලට් හා ටොෆි | 5·5 | 10·0 | 7·0 | 8·3 |
| අනෙකුත් | 3·5 | 2·5 | 2·4 | 1·4 |
| **v.** සිසිල් බීම සහ අංගාරික ජලය | **13·4** | **16·0** | **11·6** | **14·5** |
| **vi.** බීර සහ ස්ටවුට් | **2·7** | **7·6** | **5·5** | **5·5** |
| **vii.** දුම්කොළ | **46·2** | **52·0** | **52·3** | **92·0** |
| **viii.** ගොතන ලද ඇඳුම් පැලඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) | **54·9** | **55·0** | **56·1** | **48·1** |
| කමිස | 25·4 | 30·3 | 37·3 | 31·6 |
| අනෙකුත් | 29·5 | 25·2 | 18·8 | 16·5 |
| **ix.** නූල් කැටීම සහ රෙදිපිළි වියීම සහ නිමකිරීම | — | **91·3** | **95·1** | **97·1** |
| **x.** පාවහන් සහ හම් නිෂ්පාදිත | **23·4** | **24·7** | **27·7** | **31 9** |
| **xi.** රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | **17·0** | **19·1** | **18·9** | **20·7** |
| මෝටර් රථ ටයර් සහ ටියුබ් | — | — | — | 8·9 |
| ටයර් නැවත පිරවීම | 11·0 | 11·1 | 11·9 | 6·7 |
| සයිකල් ටයර් සහ ටියුබ් | 4·2 | 4·9 | 3·4 | 2·0 |
| අනෙකුත් | 1·8 | 3·1 | 3·6 | 3·1 |
| **xii.** විවිධ රසායනික නිෂ්පාදිත | **73·7** | **91·2** | **101·9** | **98·2** |
| ඖෂධ (ග්ලිසරීන් ඇතුළුව) | 5·2 | 9·5 | 13·2 | 13·6 |
| විලේපන | 6·2 | 7·5 | 7·8 | 9·4 |
| සබන් සහ පවිත්‍ර කිරීමේ සංයෝග | 39·0 | 47·6 | 49·7 | 44·4 |
| ගිණි පෙට්ටි | 10·3 | 12·3 | 8·7 | 6·7 |
| දන්තා ලේප | 3·3 | 3·4 | 4·4 | 4·4 |
| අනෙකුත් | 9·7 | 10·9 | 18·1 | 19·7 |
| **xiii.** කඩදාසි, කඩදාසි භාණ්ඩ සහ කඩදාසි බෝඩ් | **30·1** | **29·3** | **33·8** | **34 7** |
| ලියන කඩදාසි (අභ්‍යාස පොත් ආදිය) | 12·1 | 10·4 | 14·2 | 11·7 |
| මුද්‍රණ කඩදාසි | 3·9 | 3·8 | 4·5 | 7·2 |
| කාටුන් සහ අනෙකුත් අහුරන පෙට්ටි | 4·6 | 5·9 | 3·1 | 2·9 |
| ඔතන කඩදාසි | 2·3 | 3·4 | 3·9 | 3·8 |
| අනෙකුත් | 7·2 | 5·8 | 8·1 | 9·1 |
| **xiv.** ලෝහ නිෂ්පාදිත | **38·5** | **44·7** | **49·0** | **54·1** |
| ඇලුමිනියම් භාණ්ඩ | 9·2 | 9·0 | 7·7 | 7·7 |
| ලෝහ භාජන | 4·9 | 9·3 | 8·5 | 8·5 |
| කටු කම්බි | 3·0 | 3·1 | 3·5 | 4·1 |
| කම්බි ඇණ | 3·9 | 3·8 | 2·9 | 2·3 |
| අනෙකුත් | 17·5 | 19·5 | 26·4 | 31·5 |
| **xv.** විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ මෙවලම් හා සැපයුම් | — | **14·0** | **20·8** | **28·1** |
| **xvi.** යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර සූත්‍ර හැර) ප්‍රවාහණ උපකරණ | — | — | — | **19 8** |
| ප්‍රවාහන යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | — | — | — | 15·8 |
| අනෙකුත් යන්ත්‍ර සූත්‍ර හා උපකරණ | — | — | — | 4·0 |
| **xvii.** සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) | 11·0 | **14·7** | **16·2** | **17·4** |
| ප්ලාස්ටික් | 5·8 | 8·8 | 10·7 | 13·8 |
| අනෙකුත් | 5·2 | 5·9 | 5·5 | 3·6 |
| **xviii.** ද්‍රව නිෂ්පාදන | — | — | — | 3·6 |
| **xix.** ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල්අඟුරු නිෂ්පාදිත | — | — | — | 10·2 |
| **xx.** පිඟන් බඩු | **2·4** | **2·4** | **2·3** | 4·4 |
| **xxi.** තුනී ලෑලි | **3·9** | **5·2** | **6·5** | 6·8 |
| **xxii.** ඛනිජ වැලි | **0·9** | **1·3** | **1·4** | **1·4** |
| **xxiii.** මූලික කාර්මික රසායන ද්‍රව්‍ය | **1·0** | **1·6** | **1·9** | **1·9** |
| **xxiv.** සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත | **23·0** | **36·5** | **28·8** | **53·5** |
| එකතුව | **537·5** | **847·0** | **850·3** | **954·2** |

* 1965 වර්ෂයේ සිට සංඛ්‍යාවන් 11 වැනි ගණය යටතේ දක්වා ඇත.

## කර්මාන්ත හා ප්‍රධාන නිෂ්පාදිත අනුව වර්ග කොට

| කර්මාන්තයෙහි සියයට ගණන | | | | මුළු කාර්මික නිෂ්පාදනයේ සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|
| 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 29·9 | 12·8 | 15·7 | 13·7 |
| 3·0 | 11·9 | 11·4 | 11·3 | 0·9 | 1·5 | 1·8 | 1·5 |
| 14·6 | 24·2 | 45·4 | 41·5 | 4·4 | 3·1 | 7·2 | 5·7 |
| 8·2 | 57·0 | 37·0 | 39·1 | 2·5 | 7·3 | 5·8 | 5·4 |
| 71·2 | — | — | — | 21·3 | — | — | — |
| 0·3 | 1·4 | 3·8 | 4·6 | 0·1 | 0·2 | 0·6 | 0·6 |
| 0·8 | 1·6 | 1·1 | 1·3 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| 1·8 | 3·9 | 1·3 | 2·2 | 0·5 | 0·5 | 0·2 | 0·3 |
| — | 100·0 | 100·0 | 100·0 | — | 22·5 | 16·7 | 14·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·7 | 0·6 | 0·6 | 0·7 |
| 60·5 | 63·0 | 62·7 | 37·3 | 0·4 | 0·4 | 0·4 | 0·3 |
| 39·5 | 37·0 | 37·3 | 62·7 | 0·3 | 0·2 | 0·2 | 0·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 5·7 | 4·1 | 4·5 | 3·5 |
| 53·1 | 42·4 | 50·8 | 48·4 | 3·0 | 1·7 | 2·3 | 1·7 |
| 17·8 | 21·8 | 24·9 | 22·5 | 1·0 | 0·9 | 1·1 | 0·8 |
| 17·2 | 28·6 | 18·1 | 24·9 | 1·0 | 1·2 | 0·8 | 0·9 |
| 11·3 | 7·2 | 6·2 | 4·2 | 0·7 | 0·3 | 0·3 | 0·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 2·5 | 1·9 | 1·4 | 1·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·5 | 0·9 | 0·6 | 0·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 8·6 | 6·1 | 6·2 | 9·6 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 10·2 | 6·6 | 6·6 | 5·0 |
| 46·3 | 54·6 | 66·5 | 65·7 | 4·7 | 3·6 | 4·4 | 3·3 |
| 53·7 | 45·4 | 33·5 | 34·3 | 5·5 | 3·0 | 2·2 | 1·7 |
| — | 100·0 | 100·0 | 100·0 | — | 10·8 | 11·2 | 10·2 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 4·3 | 2·9 | 3·3 | 3·3 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 3·2 | 2·3 | 2·2 | 2·2 |
| — | — | — | 43·0 | — | — | — | 0·9 |
| 64·7 | 58·1 | 63·0 | 32·3 | 2·0 | 1·3 | 1·4 | 0·7 |
| 24·7 | 25·7 | 18·0 | 9·7 | 0·8 | 0·6 | 0·4 | 0·2 |
| 10·6 | 16·2 | 19·0 | 15·0 | 0·3 | 0·4 | 0·4 | 0·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 13·7 | 10·8 | 12·0 | 10·3 |
| 7·1 | 10·4 | 13·0 | 13·9 | 1·0 | 1·1 | 1·6 | 1·4 |
| 8·4 | 8·2 | 7·7 | 9·6 | 1·2 | 0·9 | 0·9 | 1·0 |
| 52·9 | 52·2 | 48·8 | 45·2 | 7·2 | 5·6 | 5·8 | 4·6 |
| 14·0 | 13·6 | 8·5 | 6·8 | 1·9 | 1·5 | 1·0 | 0·7 |
| 4·5 | 3·7 | 4·3 | 4·5 | 0·6 | 0·4 | 0·5 | 0·5 |
| 13·2 | 12·0 | 17·7 | 20·0 | 1·8 | 1·3 | 2·1 | 2·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 5·6 | 3·4 | 4·0 | 3·6 |
| 40·2 | 35·5 | 42·0 | 33·7 | 2·2 | 1·2 | 1·7 | 1·2 |
| 13·0 | 13·0 | 13·3 | 20·7 | 0·7 | 0·4 | 0·5 | 0·8 |
| 15·3 | 20·1 | 9·2 | 8·4 | 0·9 | 0·7 | 0·4 | 0·3 |
| 7·6 | 11·6 | 11·5 | 11·0 | 0·4 | 0·4 | 0·5 | 0·4 |
| 23·9 | 19·8 | 24·0 | 26·2 | 1·3 | 0·7 | 1·0 | 0·9 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 7·2 | 5·3 | 5·8 | 5·7 |
| 23·9 | 20·1 | 15·7 | 14·2 | 1·7 | 1·1 | 0·9 | 0·8 |
| 12·7 | 20·8 | 17·3 | 15·7 | 0·9 | 1·1 | 1·0 | 0·9 |
| 7·8 | 7·0 | 7·2 | 7·6 | 0·6 | 0·4 | 0·4 | 0·4 |
| 10·1 | 8·5 | 5·9 | 4·3 | 0·7 | 0·4 | 0·3 | 0·3 |
| 45·5 | 43·6 | 53·9 | 58·2 | 3·3 | 2·3 | 3·1 | 3·3 |
| — | 100·0 | 100·0 | 100·0 | — | 1·7 | 2·4 | 3·1 |
| — | — | — | 100·0 | — | — | — | 2·1 |
| — | — | — | 79·8 | — | — | — | 1·7 |
| — | — | — | 20·2 | — | — | — | 0·4 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 2·0 | 1·7 | 1·9 | 1·8 |
| 52·7 | 59·9 | 66·0 | 79·3 | 1·1 | 1·0 | 1·3 | 1·4 |
| 47·3 | 40·1 | 34·0 | 20·7 | 1·0 | 0·7 | 0·6 | 0·4 |
| — | – | — | 100·0 | — | — | — | 0·4 |
| — | — | — | 100·0 | — | — | — | 1·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·4 | 0·3 | 0·3 | 0·5 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·7 | 0·6 | 0·8 | 0·7 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·2 | 0·2 | 0·2 | 0·1 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| 100·0 | 100·0 | 100·0 | 100·0 | 4·3 | 4·3 | 3·4 | 5·6 |
| | | | | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව.

## සංඛ්‍යා සටහන II (ආ) 3

### 1964/67 කාර්මික නිෂ්පාදනයේ වටිනාකම — ප්‍රධාන ආර්ථික ගණ අනුව

| | රුපියල් දශ ලක්ෂ | | | | සියයට ගණන | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1964 | 1965 | 1966 | 1967 | 1964 | 1965 | 1966 | 1967 |
| **අ. පාරිභෝගික භාණ්ඩ** | **340·1** | **456·9** | **480·3** | **528 9** | **63·3** | **53·9** | **56 5** | **55·4** |
| ආහාර පාන හා දුම්කොළ | 133·0 | 143·9 | 144·0 | 185·7 | 24·8 | 17·0 | 16·9 | 19·5 |
| විවිධ ආහාර නිෂ්පාදන (1) | 36·0 | 28·0 | 30 9 | 33·7 | 6·7 | 3·4 | 3·6 | 3·5 |
| කල් තබාගත් හා ටින්වල අසුරන ලද පළතුරු, එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර (2) | 3·8 | 5·4 | 5·1 | 6·7 | 0·8 | 0·6 | 0·6 | 0·7 |
| විස්කෝතු හා රසකැවිලි | 30·9 | 34·9 | 38·6 | 33·3 | 5·7 | 4·1 | 4·5 | 3·5 |
| සිසිල් බීම | 13·4 | 16·0 | 11·6 | 14·5 | 2·5 | 1·9 | 1·4 | 1·5 |
| බීර සහ ස්ටවුට් | 2·7 | 7·6 | 5·5 | 5·5 | 0·5 | 0·9 | 0·6 | 0·6 |
| දුම්කොළ | 46·2 | 52·0 | 52·3 | 92·0 | 8·6 | 6·1 | 6·2 | 9·7 |
| ඇඳුම් (3) | 54·9 | 55·5 | 56·1 | 48·1 | 10·2 | 6·5 | 6·6 | 5·0 |
| පාවහන් හා හම් නිෂ්පාදිත | 23·4 | 24·7 | 27·7 | 31·9 | 4·3 | 2·9 | 3·3 | 3·3 |
| විවිධ රසායනික නිෂ්පාදිත (4) | 73·7 | 91·2 | 101·9 | 98·2 | 13·7 | 10·8 | 12·0 | 10·3 |
| කඩදාසි, කඩදාසි උපකරණ හා කඩදාසි බෝඩ (5) | 19·2 | 16·2 | 22·3 | 20·8 | 3·6 | 1·9 | 2·6 | 2·2 |
| ලෝහ නිෂ්පාදිත (6) | 9·2 | 9·0 | 7·7 | 7·7 | 1·7 | 1·0 | 0·9 | 0·8 |
| සකස් කළ නිෂ්පාදිත (වෙන තැනක නොසඳහන්) (7) | 11·0 | 14·7 | 16·2 | 17·4 | 2·0 | 1·7 | 1·9 | 1·8 |
| පිඟන් බඩු | 2·4 | 2·4 | 2·3 | 4·4 | 0·4 | 0·3 | 0·3 | 0·5 |
| රබර් භාණ්ඩ (8) | 13·3 | 8·0 | 7·0 | 14·0 | 2·5 | 1·0 | 0·8 | 1·4 |
| නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම | — | 91·3 | 95·1 | 97·1 | — | 10·8 | 11·2 | 10·2 |
| දැව නිෂ්පාදිත | — | — | — | 3·6 | — | — | — | 0·4 |
| **ආ. අන්තර් භාණ්ඩ** | **146·3** | **316·1** | **296 5** | **297·2** | **27·2** | **37·3** | **34·9** | **31·2** |
| විවිධ ආහාර නිෂ්පාදන (9) | 124·7 | 271·6 | 245·9 | 236·6 | 23·2 | 32·1 | 28·9 | 24·8 |
| ලෝහ නිෂ්පාදිත (10) | 4·9 | 9·3 | 8·5 | 8·5 | 0·9 | 1·1 | 1·0 | 0·9 |
| කඩදාසි, කඩදාසි උපකරණ හා බෝඩ(11) | 10·9 | 13·1 | 11·5 | 13·9 | 2·0 | 1·5 | 1·4 | 1·5 |
| තුනී ලෑලි | 3·9 | 5·2 | 6·5 | 6·8 | 0·7 | 0·6 | 0·8 | 0·7 |
| ඛනිජ වැලි | 0·9 | 1·3 | 1·4 | 1·4 | 0·2 | 0·2 | 0·2 | 0·1 |
| මූලික කාර්මික රසායන ද්‍රව්‍ය (12) | 1·0 | 1·6 | 1·9 | 1·9 | 0·2 | 0·2 | 0·2 | 0·2 |
| විදුලි භාණ්ඩ | — | 14·0 | 20·8 | 28·1 | — | 1·6 | 2·4 | 3·0 |
| **ඇ. ආයෝජන භාණ්ඩ** | **51·1** | **74·0** | **73 5** | **128·1** | **9·5** | **8·7** | **8·6** | **13·4** |
| ලෝහ නිෂ්පාදිත (13) | 24·4 | 26·4 | 32·8 | 37·9 | 4·5 | 3·1 | 3·8 | 4·0 |
| රබර් නිෂ්පාදිත (14) | 3·7 | 11·1 | 11·9 | 6·7 | 0·7 | 1·3 | 1·4 | 0·7 |
| සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත | 23·0 | 36·5 | 28·8 | 53·5 | 4·3 | 4·3 | 3·4 | 5·6 |
| යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍ර සූත්‍ර හැර) සහ ප්‍රවාහන උපකරණ | — | — | — | 19·8 | — | — | — | 2·0 |
| ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත | — | — | — | 10·2 | — | — | — | 1·1 |
| **එකතුව** | **537·5** | **847·0** | **850·3** | **954·2** | **100·0** | **100·0** | **100·0** | **100·0** |

සංඛ්‍යා: ශ්‍රී ලංකා මහ බැංකුව

සංලක්ෂ්‍යා:–

(1) කිරි නිෂ්පාදිත අයිස් ක්‍රීම් සහ ලුණු.
(2) ජෑම්, ජෙලි, සෝස්, පළතුරු කෝඩියල් යනාදිය.
(3) කමිස සහ බැනියන් යනාදිය.
(4) ඖෂධ, විලේපන, සබන් හා පවිත්‍ර කිරීමේ සංයෝග, ගිනිපෙට්ටි, දන්තාලේප යනාදිය.
(5) ලියන කඩදාසි, අභ්‍යාස පොත් යනාදිය.
(6( ඇලුමිනියම් භාණ්ඩ.
(7) ප්ලාස්ටික් භාණ්ඩ යනාදිය.
(8) මෝටර් කාර් සහ සයිකල් ටයර් හා ටියුබ්, සෙල්ලම් බඩු හා ගෘහෝපකරණ
(9) ගව හා කුකුල් කෑම, එළවළු තෙල්, අයිස්, කපාපු පොල් යනාදිය.
(10) භාජන.
(11) මුද්‍රණ කඩදාසි, කාටුන්, ඇසුරුම් පෙට්ටි හා ඔතන කඩදාසි.
(12) කෝස්ටික් සෝඩා සහ ක්ලෝරයින්.
(13) කටුකම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් නිෂ්පාදිත යනාදිය.
(14) ටයර් නැවත පිරවීම.

පසුගිය වර්ෂයන්හි දී මෙන්ම, නිපැයුණු පාරිභෝගික භාණ්ඩ වලින් විශාල කොටසක් සැකසුනේ **ආහාර පාන සහ දුම්කොල** වලිනි. වැඩිවීම විශේෂයෙන් දුම්කොල සම්බන්ධයෙන් විශාල වූ අතර, එය රුපියල් දශ ලක්ෂ 39·7 ක ප්‍රමාණයක් විය. අනෙකුත් උප කොටස් **ඇඳුම්, පැළඳුම්, පාවහන්, සම්භාණ්ඩ, විවිධ රසායන නිෂ්පාදිතයන්, නූල් කැටීම්, විවීම සහ රෙදිපිළි වියා අවසාන කිරීම,** 1967 පාරිභෝගික භාණ්ඩ වටිනාකමින් සියයට 52 ක ප්‍රමාණයක් විය.

ආයෝජන භාණ්ඩවල අගය තියුණු ලෙස වැඩිවීමට ප්‍රධාන හේතුව වශයෙන් දැක්විය හැක්කේ, **සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදනය** නිමැවුමෙහි වූ සීඝ්‍ර වර්ධනයත්, තවත් කාර්මික නිෂ්පාදන දෙවර්ගයක්, එනම් **යන්ත්‍ර (විදුලි යන්ත්‍ර හැර) ප්‍රවාහණ උපකරණ සහ ලෝහ නොවන ඛණිජ ද්‍රව්‍ය නිෂ්පාදනයන්**, ගල් අඟුරු සහ ඛණිජ තෙල් නිෂ්පාදනයන් එකතු කිරීමත්ය.

1967 දී කාර්මික නිෂ්පාදනයෙහි මුළු වටිනාකමෙහි වැඩිවීම වන රුපියල් දශලක්ෂ 103·9 යෙන් සියයට 60 කට හේතු වී ඇත්තේ, **දුම්කොල හා සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත** කර්මාන්ත වල සිදු වූ ප්‍රසාරණයයි. පසුව කී කර්මාන්තයේ නිමැවුමෙහි වැඩිවීමට සම්පූර්ණයෙන් ම හේතු වී ඇත්තේ, සිමෙන්ති නිමැවුමෙහි වටිනාකමේ වැඩිවීමය. ඒ අතර, සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදිත සමාගම් වල නිමැවුමෙහි වටිනාකම අඩුවුනත්, එය සිමෙන්ති නිෂ්පාදනයේ වැඩිවීමෙන් උවමනාවටත් වඩා මැකුණි. නිමැවුම් වටිනාකමේ වැඩිවීම් පෙන්වන අනෙක් කර්මාන්ත කිහිපයෙකි ඒවා නම් **කල් තබාගැනීමට ටින් වල අසුරන ලද පලතුරු, එළවළු, මස් මාංශ සහ මුහුදෙන් ලැබෙන අනෙකුත් ආහාර, සිසිල් බීම සහ අංගාරික ජලය, නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිමා කිරීම, පාවහන් සහ සම් නිෂ්පාදිත සහ** (පාවහන් හැර) **රබර්** නිෂ්පාදනයත්ය.

**ලෝහ භාණ්ඩ** කර්මාන්තයේ නිමැවුමෙහි වටිනාකම 1960 සිට වැඩි වෙමින් පැවතුන අතර, 1967 දී ද, මෙසේ පුළුල් වන නිෂ්පාදන අනුපාතය එසේම පවත්වා ගැනීමට හැකිවුනි. 1966 රුපියල් දශලක්ෂ 49·0 ක් වූ අතර, මේ වර්ෂයේ නිමැවුමේ වටිනාකම රුපියල් දශලක්ෂ 54·1 ක් විය. මෙම පුළුල් වීම සිදු වී ඇත්තේ කාර්මික ආයෝජන භාණ්ඩ කොටසෙහිය. එනම්, කටු කම්බි, කම්බි ඇණ, ගැල්වනයිස් නිෂ්පාදිත අංශයෙහිය.

**කාර්මික ඒකක වල විශාලත්වය**

II (ආ) අ. 4 වැනි සංඛ්‍යා සටහනෙහි, නිෂ්පාදන වටිනාකම් අනුව, ව්‍යාපාර ආයතනයන්ගේ විශාලත්වය බෙදී ගිය අයුරු දැක්වෙයි. තොරතුරු සපයා ඇති සමාගම් සංඛ්‍යාව වූ 1069 න් (1966 දී 791) සියයට 75·6 න් වර්ෂයකට රුපියල් 2,50,000 සිට රුපියල් දශලක්ෂ 2 දක්වා වටිනාකමක් ඇති නිමැවුම් ඇති ආයතන 1267 දී සියයට 18·9 ක් වූ අතර, එම ආයතන වල ඒකාබද්ධ නිමැවුම මුළු නිමැවුමෙන් සියයට 25·3 ක් විය. රුපියල් දශලක්ෂ 2 කට වැඩි වාර්ෂික නිමැවුමක් ඇති ව්‍යාපාර ආයතන වල සංඛ්‍යාව වූයේ සියයට 5·5 ක් පමණක් වුවද, මුළු වාර්ෂික නිමැවුමෙහි එම ආයතන වල කොටස සියයට 66·4 ක් විය.

**සංඛ්‍යා සටහන II (ආ) 4 (1)**
**සමාගමේ පරිමාණය හා නිමැවුම**

| | සමාගම් එකතුවේ % වශයෙන් | | නිමැවුම එකතුවේ % වශයෙන් | |
|---|---|---|---|---|
| | 1966 | 1967 | 1966 | 1967 |
| 0 – රුපියල් 250,000 .. .. .. | 66·6 | 75·6 | 7·8 | 8·3 |
| රුපියල් 250,000 – රුපියල් දශ ලක්ෂ 2 .. .. | 27·2 | 18·9 | 28·6 | 25·3 |
| රුපියල් දශ ලක්ෂ 2 සහ එයට වැඩි .. .. | 6·2 | 5·5 | 63·6 | 66·4 |
| | 100·0 | 100·0 | 100·0 | 100·0 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ආ) 4

## 1967 නිෂ්පාදන සමාගම් විශාලත්වය අනුව බෙදී ගිය අයුරු නිෂ්පාදන වටිනාකම පදනම් කොට

| කාර්මික ගණය | | නිෂ්පාදන වටිනාකම | | | |
|---|---|---|---|---|---|
| | | රු. < 250 දහස් | රු. < 250 දහස් 2 දශ ලක්ෂ | රු. > 2 දශ ලක්ෂ හා ඊට වැඩි | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. | සමාගම් ගණන | | | | |
| | නිමැවුමේ % | | ලබා ගැනීමට නොමැත | | |
| II. එළවළු තෙල් සහ මේද .. | සමාගම් ගණන | | | | |
| | නිමැවුමේ % | | ලබා ගැනීමට නොමැත | | |
| III. කල් තබාගත් සහ ටින් වල අසුරන ලද එළවළු මස් මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. | සමාගම් ගණන | 25 | 4 | 1 | 30 |
| | නිමැවුමේ % | 20·3 | 28·6 | 51·1 | 100 |
| IV. විස්කෝතු සහ කොකෝවා චොකලට් සහ රසකැවිලි .. | සමාගම් ගණන | 40 | 12 | 5 | 57 |
| | නිමැවුමේ % | 9·1 | 24·4 | 66·5 | 100 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. | සමාගම් ගණන | 11 | 6 | 1 | 18 |
| | නිමැවුමේ % | 3·4 | 29·3 | 67·3 | 100 |
| VI. බිර සහ ස්ටවුට් .. | සමාගම් ගණන | | 1 | 1 | 2 |
| | නිමැවුමේ % | | 28·6 | 71·4 | 100 |
| VII. දුම්කොළ .. | සමාගම් ගණන | | | | |
| | නිමැවුමේ % | | ලබා ගැනීමට නොමැත | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් .. | සමාගම් ගණන | 138 | 31 | 3 | 172 |
| | නිමැවුමේ % | 19·8 | 41·9 | 38·3 | 100 |
| IX. නූල් කැටීම, රෙදිපිළි වියීම සහ නිම කිරීම .. | සමාගම් ගණන | 101 | 22 | 7 | 130 |
| | නිමැවුමේ % | 4·8 | 16·3 | 78·9 | 100 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 81 | 7 | 3 | 91 |
| | නිමැවුමේ % | 13·8 | 16·5 | 69·7 | 100 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | සමාගම් ගණන | 18 | 11 | 2 | 31 |
| | නිමැවුමේ % | 6·9 | 36·6 | 56·5 | 100 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. | සමාගම් ගණන | 122 | 21 | 11 | 154 |
| | නිමැවුමේ % | 7·2 | 12·8 | 80·0 | 100 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ හා කඩදාසි භාණ්ඩ .. | සමාගම් ගණන | 59 | 18 | 1 | 78 |
| | නිමැවුමේ % | 11·5 | 35·3 | 53·2 | 100 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. | සමාගම් ගණන | 83 | 35 | 9 | 127 |
| | නිමැවුමේ % | 8·4 | 43·2 | 48·4 | 100 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපයුම් .. | සමාගම් ගණන | 20 | 15 | 3 | 38 |
| | නිමැවුමේ % | 6·7 | 54·2 | 39·1 | 100 |
| XVI. යන්ත්‍ර සූත්‍ර (විදුලිය යන්ත්‍රෝපකරණ හැර) සහ ප්‍රවාහන උපකරණ .. | සමාගම් ගණන | 10 | 4 | 4 | 18 |
| | නිමැවුමේ % | 5·8 | 19·8 | 74·4 | 100 |
| XVII. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. | සමාගම් ගණන | 81 | 9 | 3 | 93 |
| | නිමැවුමේ % | 19·5 | 39·1 | 41·4 | 100 |
| XVIII. දැව නිෂ්පාදිත .. | සමාගම් ගණන | 10 | 3 | | 13 |
| | නිමැවුමේ % | 15·7 | 84·3 | — | 100 |
| XIX. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. | සමාගම් ගණන | | | | |
| | නිමැවුමේ % | | ලබා ගැනීමට නොමැත | | |
| XX. පිහන් බඩු .. | සමාගම් ගණන | | | 1 | 1 |
| | නිමැවුමේ % | | | 100 | 100 |
| XXI. තුනී ලෑලි .. | සමාගම් ගණන | | | 1 | 1 |
| | නිමැවුමේ % | — | — | 100 | 100 |
| XXII. ඛනිජ වැලි .. | සමාගම් ගණන | | 1 | | 1 |
| | නිමැවුමේ % | — | 100 | — | 100 |
| XXII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | සමාගම් ගණන | | 1 | | 1 |
| | නිමැවුමේ % | — | 100 | — | 100 |
| XXIV. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 9 | 1 | 3 | 13 |
| | නිමැවුමේ % | 1·0 | 3·4 | 95·6 | 100 |
| එකතුව .. | සමාගම් ගණන | 808 | 202 | 59 | 1069 |
| | නිමැවුමේ % | 8·3 | 25·3 | 66·4 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**කල් පවතින ලෙස අසුරන ලද පලතුරු, එළවළු, මස් මාංශ හා මුහුදෙන් ලැබෙන අනෙකුත් ආහාර** වල නිෂ්පාදිත ගනයෙහි 1966 දී ව්‍යාපාර ආයතන 21 ක් විසින් මුළු නිෂ්පාදනයෙන් සියයට 26·7 ක් නිපද වූ අතර, 1967 දී ව්‍යාපාර ආයතන සංඛ්‍යාව 25 දක්වා වැඩි වුවද, නිෂ්පාදනය සියයට 20·3 දක්වා පහළ වැටුණි. රුපියල් 2,50,000 සිට රුපියල් දශලක්ෂ 2 දක්වා වටිනාකමකින් යුත්, නිමැවුමක් ඇති ව්‍යාපාර ආයතන වල සාපේක්ෂ වැදගත් කමේ කැපී පෙනෙන වෙනසක් සිදු විය. 1966 දී මුළු නිමැවුමෙන් සියයට 73·3 ක ප්‍රමාණයක් ව්‍යාපාර ආයතන 5 ක් විසින් නිපදවන ලද අතර, 1967 දී ව්‍යාපාර ආයතන 4 ක් විසින් නිපදවන ලද්දේ මුළු නිමැවුමෙන් සියයට 28·6 ක් පමණි. රුපියල් දශලක්ෂ 2 කට වැඩි මුළු වාර්ෂික නිමැවුමකින් යුත් එක ආයතනයක් විසින් මෙම ගනයේ මුළු නිමැවුමෙන් සියයට 52 කට ආසන්න ප්‍රමාණයක් නිපදවන ලදී.

කර්මාන්ත ගන කිහිපයකදීම, මුළු නිමැවුමෙන් වැදගත් ප්‍රමාණයක්, එක සමාගමක් නැතහොත් සමාගම් කිහිපයක් විසින් පාලනය කරන ලදී. **සිසිල් බීම සහ අංගාරික ජලය** ගනයෙහි එක ආයතනයක් විසින් මුළු නිමැවුමෙන් සියයට 67·3 ක් නිපදවා ඇති අතර, **විස්කෝතු, කොකෝවා, චොකලට් හා රස කැවිලි** ගනයෙහි ආයතන 5 ක් විසින් සැපයුමෙන් සියයට 66·5 ක් ද නිපදවා ඇත. **කිර සහ ස්ටවුට් කර්මාන්ත** යෙහි ආයතන දෙකක් පමණක් පැවති අතර එක ආයතනයක් මුළු නිමයුමෙන් සියයට 71·4 ක් සපයන ලදී. **පාවහන් සහ සම්භාණ්ඩ (පාවහන් හැර) විවිධ රසායනික නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර හා ප්‍රවාහණ උපකරණ, සිමෙන්ති සහ සිමෙන්ති නිෂ්පාදිත** ගනයෙහි විශාල ව්‍යාපාර ආයතන කිහිපයක් විසින් දේශීය වෙළඳ පොළෙහි වැදගත් කොටසක් අයත් කොට ගෙන තිබුණි.

II (ආ) 5 සංඛ්‍යා සටහන වැටුප් බිල අනුව නිෂ්පාදන ආයතන විශාලත්වය බෙදී ගිය අයුරු දක්වයි. වැටුප් බිල ආයතනයක විශාලත්වය හරිහැටි පෙන්වන්නක් නොවුණත් සංඛ්‍යා සටහන් දෙක සසඳන කල එම දෙක අතර සම්බන්ධතාවයක් පෙනේ. කාර්මික ආයතන වලින් වැඩිම ගණනක්, වැටුපෙන් වර්ෂයකට රුපියල් 15000 අඩු මුළු වැටුප් බිලක් ඇති ගනයටය. **රෙදි හා වෙනත් දේ මැසීම සහ මැසූ ඇඳුම් කර්මාන්තයෙහි** ආයතන ගණන 99 කි. **සපත්තු හා සම්භාණ්ඩ කර්මාන්තයේ** ආයතන ගණන 62 කි. නූල් කැටීම, විවීම හා රෙදි නිමවීම කර්මාන්තයේ 83 කි. **විවිධ රසායනික නිෂ්පාදිත කර්මාන්තයේ** 106 කි.

වර්ෂයකට රුපියල් 500,000 ඉක්මවූ වැටුප් බිලක් ඇති ආයතන ගණන අඩු වන්නට විය. **සිසිල් බීම හා අංගාර වතුර** කොටසෙහි එක සමාගමක් මුළු වැටුප් බිලෙන් සියයට 78·5 කට කඩදාසි, **කඩදාසි ද්‍රව්‍ය හා කඩදාසි බෝඩ් කොටසෙහි ආයතනයක්** වැටුප් බිලෙන් සියයට 56·5 කට ද වග කීවේය.

අමු ද්‍රව්‍ය ප්‍රයෝජනයට ගැනීම

කාර්මික සමාගම් 1830 ක් ඒවායේ නිෂ්පාදන තත්ත්වයන් පිළිබඳ සංඛ්‍යා තොරතුරු සපයනු ලැබූ අතර, අමු ද්‍රව්‍ය පාවිච්චිය සහ ඒවා ලද අයුරු පිළිබඳ සංඛ්‍යා තොරතුරු ලැබුනේ කාර්මික සමාගම් 563 කින් පමණි. අමු ද්‍රව්‍ය වල නිෂ්පාදිතය දේශීය හෝ විදේශීය වශයෙන් ලැබුණු මාගීය අනුව, ඒවා වර්ග කරන ලදී. මෙම සංඛ්‍යා තොරතුරු II (ආ) 6 සංඛ්‍යා සටහනේ දක්වා ඇත. සංඛ්‍යා තොරතුරු සැපයූ කාර්මික සමාගම් විසින් උපයෝගී කොට ගත් අමු ද්‍රව්‍ය වල මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 166·3 ක් විය. එයින් 64·8 ක් හෙවත් රුපියල් දශලක්ෂ 107·7 ක් ආනයනය කරන ලද, අමු ද්‍රව්‍ය වූ අතර, රුපියල් දශලක්ෂ 58·4 ක් හෙවත් සියයට 35·2 ක් දේශීය අමු ද්‍රව්‍ය විය. සංඛ්‍යා තොරතුරු සැපයූ සමාගම්, දේශීය වෙළෙඳ පොළේ තොග වෙළෙඳුන්ගෙන් මිලදී ගත් ආනයනය කළ අමු ද්‍රව්‍ය ද දේශීය වශයෙන් ලැබුණු

## සංඛ්‍යා සටහන II (ආ) 5

## 1967 නිෂ්පාදන සමාගම් විශාලත්ව අනුව බෙදී ගිය අයුරු – වැටුප් ලැයිස්තු පදනම් කොට

| කාර්මික ගණය | | රුපි. < 15 දහස් | රුපි. < 15 දහස් 50 දහස් | රුපි. < 50 දහස් 500 දහස් | රුපි. 500 දහස් සහ ඊට වැඩි | එකතුව |
|---|---|---|---|---|---|---|
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| II. එළවළු, තෙල් සහ මේද .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| III. කල් තබාගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. | සමාගම් ගණන | 23 | 5 | 2 | | 30 |
| | වැටුපේ % | 20·6 | 25·0 | 54·4 | — | 100 |
| IV. බිස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රසකැවිලි .. | සමාගම් ගණන | 30 | 15 | 11 | 1 | 57 |
| | වැටුපේ % | 5·4 | 15·7 | 44·1 | 34·8 | 100 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය .. | සමාගම් ගණන | 11 | 2 | 4 | 1 | 18 |
| | වැටුපේ % | 1·0 | 1·8 | 18·7 | 78·5 | 100 |
| VI. බිර සහ ස්ටවුට් .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| VII. දුම්කොළ .. .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. | සමාගම් ගණන | 99 | 48 | 22 | 3 | 172 |
| | වැටුපේ % | 8·8 | 19·7 | 38·2 | 33·3 | 100 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම .. .. | සමාගම් ගණන | 83 | 23 | 20 | 4 | 130 |
| | වැටුපේ % | 3·1 | 4·2 | 16·4 | 76·3 | 100 |
| X. පාවහන් සහ හම් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 62 | 19 | 8 | 2 | 91 |
| | වැටුපේ % | 6·3 | 7·6 | 19·8 | 66·3 | 100 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | සමාගම් ගණන | 11 | 10 | 9 | 1 | 31 |
| | වැටුපේ % | 2·0 | 8·3 | 31·2 | 58·5 | 100 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. | සමාගම් ගණන | 106 | 26 | 17 | 5 | 154 |
| | වැටුපේ % | 5·0 | 7·0 | 25·7 | 62·3 | 100 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ හා කඩදාසි භාණ්ඩ ... .. | සමාගම් ගණන | 42 | 21 | 14 | 1 | 78 |
| | වැටුපේ % | 4·2 | 11·2 | 28·1 | 56·5 | 100 |
| XIV. ලෝහ නිෂ්පාදිත .. | සමාගම් ගණන | 63 | 28 | 34 | 2 | 127 |
| | වැටුපේ % | 4·5 | 9·7 | 57·9 | 27·9 | 100 |
| XV. විදුලි යන්ත්‍රසූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපැයුම් .. | සමාගම් ගණන | 12 | 12 | 14 | | 38 |
| | වැටුපේ % | 2·1 | 11·1 | 86·8 | — | 100 |
| XVI. යන්ත්‍ර සූත්‍ර (විදුලිය යන්ත්‍රොපකරණ හැර) සහ ප්‍රවාහන උපකරණ .. .. | සමාගම් ගණන | 4 | 4 | 8 | 2 | 18 |
| | වැටුපේ % | 0·9 | 5·2 | 33·9 | 60·0 | 100 |
| XVII. සකස් කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. | සමාගම් ගණන | 70 | 12 | 11 | | 93 |
| | වැටුපේ % | 19·6 | 20·4 | 60·0 | — | 100 |
| XVIII. දුව නිෂ්පාදන .. | සමාගම් ගණන | 9 | 1 | 3 | | 13 |
| | වැටුපේ % | 8·9 | 4·3 | 86·8 | — | 100 |
| XIX. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. | සමාගම් ගණන | | | | | |
| | වැටුපේ % | | ලබා ගැනීමට නොමැත | | | |
| XX. පිහන් බඩු .. .. | සමාගම් ගණන | | | | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100 | 100 |
| XXI. තුනී ලෑලි .. .. | සමාගම් ගණන | | | | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100 | 100 |
| XXII. ඛනිජ වැලි .. .. | සමාගම් ගණන | | | | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100 | 100 |
| XXIII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | සමාගම් ගණන | | | | 1 | 1 |
| | වැටුපේ % | — | — | — | 100 | 100 |
| XXIV. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත .. | සමාගම් ගණන | 6 | 3 | 2 | 2 | 13 |
| | වැටුපේ % | 0·6 | 1·5 | 11·3 | 86·6 | 100 |
| එකතුව .. | සමාගම් ගණන | 631 | 229 | 179 | 28 | 1,067 |
| | වැටුපේ % | 4·1 | 7·7 | 29·8 | 58·4 | 100 |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

## සංඛ්‍යා සටහන II (ආ) 6
## නිෂ්පාදනය අමු ද්‍රව්‍ය -1967

රුපියල් දහස් ගණනින්

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | නිෂ්පාදනය | අමු ද්‍රව්‍ය | | |
|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදිත | 22 | 28,326 | (65·5)<br>14,948 | (34·5)<br>7,858 | (100·0)<br>22,068 |
| II. එළවළු, තෙල් සහ මේද | | | ලබා ගැනීමට නොමැත | | |
| III. කල්තබාගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස් මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර | 15 | 1,882 | (53·3)<br>361 | (46·7)<br>316 | (100·0)<br>677 |
| IV. බිස්කෝතු සහ කොකෝවා, චොකොලට් සහ රස කැවිලි | 26 | 16,064 | (49·0)<br>3,861 | (51·0)<br>4,022 | (100·0)<br>7,883 |
| V. සිසිල් බීම සහ අංගාරික ජලය | 10 | 13,202 | (32·8)<br>1,802 | (67·2)<br>3,689 | (100·0)<br>5,491 |
| VI. බීර සහ ස්ටවුට් | 2 | 5,463 | — | (100·0)<br>2,375 | (100·0)<br>2,375 |
| VII, දුම්කොළ | | | ලබා ගැනීමට නොමැත | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් පාවහන් හැර | 100 | 18,837 | (40·2)<br>4,582 | (59·8)<br>6,827 | (100·0)<br>11,409 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිම කිරීම | 67 | 43,665 | (14·4)<br>2,031 | (85·6)<br>12,106 | (100·0)<br>14,137 |
| X. පාවහන් සහ හම් නිෂ්පාදන | 37 | 6,133 | (53·0)<br>1,301 | (41·0)<br>1,155 | (100·0)<br>2,456 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) | 17 | 13,110 | (45·7)<br>2,067 | (54·3)<br>2,460 | (100·0)<br>4,527 |
| XII. විවිධ රාසයනික නිෂ්පාදිත | 71 | 34,036 | (26·9)<br>3,262 | (73·1)<br>8,869 | (100·0)<br>12,131 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ් හා කඩදාසි භාණ්ඩ | 31 | 23,599 | (62·5)<br>7,029 | (37·5)<br>4,218 | (100·0)<br>11,247 |
| XIV. ලෝහ නිෂ්පාදිත | 72 | 47,224 | (7·0)<br>1,878 | (93·0)<br>24,779 | (100·0)<br>26,657 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපැයුම් | 19 | 20,003 | (18·1)<br>1,930 | (81·9)<br>8,740 | (100·0)<br>10,670 |
| XVI. යන්ත්‍ර සූත්‍ර, (විදුලිය යන්ත්‍රෝපකරණ හැර) සහ ප්‍රවාහන | 16 | 19,620 | (36·5)<br>4,354 | (63·5)<br>7,581 | (100·0)<br>11,935 |
| XVII යකස් කල නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) | 36 | 5,326 | (9·7)<br>300 | (90·3)<br>2,793 | (100·0)<br>3,093 |
| XVIII. දැව නිෂ්පාදිත | 13 | 3,566 | (94·7)<br>1,865 | (5·3)<br>104 | (100·0)<br>1,969 |
| XIX. ලෝහ නොවන ඛණිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත | | | ලබා ගැනීමට නොමැත | | |
| XX· පිහන් බඩු | | | ලබා ගැනීමට නොමැත | | |
| XXI. තුනී ලෑලි | | | ලබා ගැනීමට නොමැත | | |
| XXII. ඛණිජ වැලි | 1 | 1,373 | (100)<br>300 | — | (100)<br>300 |
| XXIII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය | | | ලබා ගැනුමට නොමැත | | |
| XXIV. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත | 8 | 53,184 | (40·4)<br>6,670 | (59·6)<br>9,842 | (100·0)<br>16·512 |
| **එකතුව** | 563 | 354,613 | (35·2)<br>58,541 | (64·8)<br>107,734 | (100·0)<br>166,275 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුවෙනි.

සංලක්ෂ්‍ය : වරහන් තුළ දැක්වෙන සංඛ්‍යා වලින් සියයට ගණන පිළිබිඹු වෙයි.

අමු ද්‍රව්‍ය වශයෙන් වර්ග කර නොතිබුනේ නම්, ආනයනය කරන ලද අමු ද්‍රව්‍ය වල නියම වටිනාකම වැඩි විය හැකිව තිබුණි. එහෙයින්, මුළු කාර්මික නිෂ්පාදන මිලෙහි විදේශීය විනිමය වැය වන කොටස, ඉතා විශාල බව පෙනේ.

**කඩදාසි, කඩදාසි භාණ්ඩ, සහ කඩදාසි බෝඩ්** ගණයෙහි අපනයනය කරන ලද අමු ද්‍රව්‍ය ප්‍රමාණය පාවිච්චි කරන ලද, අමු ද්‍රව්‍ය ප්‍රමාණයෙන් සියයට 37·5 ක් වූ අතර, **විවිධ ආහාර නිෂ්පාදන** ගණයෙහි එවා සියයට 34·5 ක් ද, **ලී භාණ්ඩ** නිෂ්පාදන ගණයෙහිදී සියයට 5·3 ක් ද විය. කල්තබා ගත හැකිසේ **ටින් වල අසුරන ලද එළවළු, මස් මාළු හා මුහුදින් ලබා ගන්නා අනෙක් ආහාර** ගණයෙහි අමු ද්‍රව්‍යවල ආනයන කොටස සියයට 46·7 ක් වූ අතර, **පාවහන් සහ හම් නිෂ්පාදිත** ගණයෙහි සියයට 41·1 ක් ද, අනෙකුත් සියළු කර්මාන්ත ගණයන්හි ම පාවිච්චි කරන ලද විදේශීය අමු ද්‍රව්‍ය ප්‍රමාණය පාවිච්චි කරන ලද මුළු අමු ද්‍රව්‍ය ප්‍රමාණයෙන් සියයට 50 කට වඩා වැඩි විය. ආනයනය කරන ලද, අමු ද්‍රව්‍ය කොටස ඉතාමත් විශාල වූයේ, පහත සඳහන් කර්මාන්තයන්හිය. **කීර සහ ස්ටවුට්** (සියයට 100 ක්) **නූල් කැටීම රෙදිපිළි විවීම සහ නිම කිරීම** (සියයට 85·6), **විවිධ රසායනික නිෂ්පාදිත** (සියයට 73·1), **ලෝහ නිෂ්පාදිත** (සියයට 93), **විදුලි යන්ත්‍ර සූත්‍ර උපකරණ, මෙවලම් සහ සැපයුම්** (සියයට 81·9) **වෙනත් තැනක සඳහන් සකස් නොකළ නිෂ්පාදිත** (සියයට 90·3).

**සේවා නියුක්තිය**

1967 වර්ෂයේදී නිෂ්පාදනයේ වටිනාකම වැඩිවීමත් සමගම කාර්මික සේවා නියුක්තියේ ප්‍රාසාරණයක් ද ඇති වුණි. නිෂ්පාදනයෙහි මුළු වටිනාකමේ පහළ බැසීමක් සිදුවෙද්දීත් **විවිධ ආහාර නිෂ්පාදන** ගණයෙහි සේවා නියුක්තියෙහි වැඩිවීමක් ඇති වුවද, එයට ප්‍රතිවිරුද්ධ ලෙස වැඩි ප්‍රාග්ධන ප්‍රතිශතයක් ඇති, **සිමෙන්ති සිමෙන්ති නිෂ්පාදිත ඇස්බැස්ටෝස් නිෂ්පාදිත** ගණයෙහි නිෂ්පාදනයෙහි වටිනාකම වැඩි වුවද, එසේ වැඩිවීම හා සසඳ බලන කළ අමතර සේවා නියුක්තිය සැපයුනේ මඳ වශයෙනි. ශ්‍රම සූක්‍ෂම කර්මාන්තයක් වන **දුම්කොළ** කර්මාන්තයෙහි නිමැවුමෙහි වටිනාකම රුපියල් දශලක්‍ෂ 39·7 කින් වැඩි වුණු අතර, සේවයේ යෙදිය සිටියවුන්ගේ සංඛ්‍යාව 1966 දී 8,235, 1967 දී 8,905 දක්වා වැඩි වුණි.

මෙම කර්මාන්ත ගණයන්ගෙන් කිහිපයක ම, සේවයේ යොදවා සිටින කම්කරු සංඛ්‍යාව වැඩි වූ අතර, සේවකයෙකු වැඩ කළ දින ගණනින් බලන කළ සේවා නියුක්තියෙහි පරිමාව 1967 දී පහළ ගොස් ඇත. **ඇඳුම් පැළඳුම් ගෙතීම්** (පාවහන් හැර) **ඇඳුම් මැසීම් හා අනෙකුත් ආයිත්තම්** ගණයෙහි සේවයේ නියුතු වුවන්ගේ සංඛ්‍යාව 1966 දී සිටි 6,916 සිට 1967 දී 6,663 දක්වා පහළ ගිය අතර, ඒ සමගම සේවකයෙකු විසින් වැඩ කරන ලද මිනිස් දින ගණන ද 234 සිට 231 දක්වා පහළ ගියේය. **නූල් කැටීම, රෙදිපිළි විවීම** සහ **නිම කිරීම** ගණයෙහි මුළු සේවා නියුක්තිය 575 කින් වැඩි වූවත්, සේවකයෙකු විසින් වැඩ කරන ලද දින ගණන 16 කින් පහළ වැටිණි.

**ඵලදායිතාව සහ වැටුප්**

වැඩ කරන ලද මුළු මිනිස් දින ගණන දශලක්‍ෂ 16·1 සිට 19·3 දක්වා වැඩි විය. පහත සඳහන් කොටස්වල වැඩ කළ මිනිස් දින ගණන දශලක්‍ෂය ඉක්ම විය. **විවිධ ආහාර නිෂ්පාදිත, දුම්කොළ, ගොතන ලද ඇඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම්, නූල් කැටීම්, රෙදිපිළි විවීම් සහ නිම කිරීම, විවිධ රසායනික නිෂ්පාදිත සහ ලෝහ නිෂ්පාදිත.**

තොරතුරු සැපයූ ව්‍යාපාරික ආයතන වල මුළු වැටුප් බිල 1966 දී වූ රුපියල් දශලක්‍ෂ 97·4 සිට 1967 දී රුපියල් දශලක්‍ෂ 128·0 දක්වා වැඩි විය. වැඩීම වැටුප් බිල වූ රුපියල් දශලක්‍ෂ 25·4 **දුම්කොළ** කර්මාන්තයේ විය. **විවිධ ආහාර නිෂ්පාදන**

## සංඛ්‍යා සටහන II (ආ) 7
## නිෂ්පාදනය හා ඉන්ධන

රුපියල් දශ ලක්ෂ

| කාර්මික ගණය | ව්‍යාපාරික ආයතන සංඛ්‍යාව | නිෂ්පාදනය | පාවිච්චි කළ ඉන්ධන | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | විදුලි බලය | ගල් අඟුරු හා ගෑස් | පැට්‍රෝල් සහ තෙල් | අනෙකුත් | එකතුව |
| I. විවිධ ආහාර නිෂ්පාදිත .. .. | 29 | 30,471 | 599 | 20 | 100 | — | 719 |
| II. එළවළු තෙල් සහ මේද .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| III. කල්තබාගත් සහ ටින්වල අසුරන ලද එළවළු, මස්, මාළු සහ මුහුදින් ලැබෙන අනෙකුත් ආහාර .. .. | 8 | 835 | 4 | 2 | 12 | ... | 18 |
| IV. විස්කෝතු සහ කොකෝවා, චොකලට් සහ රස කැවිලි .. .. | 20 | 12,381 | 96 | 41 | 90 | 24 | 251 |
| V. සිසිල්බීම සහ අංගාරික ජලය .. | 7 | 11,079 | 45 | 5 | 79 | — | 129 |
| VI. බීර සහ ස්ටවුට් .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| VII. දුම්කොළ .. .. .. | | | ලබා ගැනීමට නෙමැත | | | | |
| VIII. ගොතන ලද ඇඳුම් පැළඳුම් සහ මැසූ ඇඳුම් සහ අනෙකුත් ආයිත්තම් (පාවහන් හැර) .. .. | 32 | 8,970 | 47 | 5 | 35 | 16 | 103 |
| IX. නූල් කැටීම, රෙදිපිළි විවීම සහ නිමකිරීම.. | 41 | 42,631 | 525 | 22 | 96 | 3 | 646 |
| X. පාවහන් හා හම් නිෂ්පාදිත .. .. | 14 | 4,519 | 31 | ... | 7 | — | 38 |
| XI. රබර් නිෂ්පාදිත (පාවහන් හැර) .. | 13 | 11,883 | 444 | 311 | 102 | ... | 857 |
| XII. විවිධ රසායනික නිෂ්පාදිත .. .. | 38 | 26,400 | 230 | 1 | 43 | 11 | 285 |
| XIII. කඩදාසි, කඩදාසි බෝඩ් හා කඩදාසි භාණ්ඩ.. | 18 | 21,733 | 475 | — | 2 | 488 | 965 |
| XIV. ලෝහ නිෂ්පාදිත.. .. .. | 50 | 33,910 | 466 | 35 | 119 | 3 | 623 |
| XV. විදුලි යන්ත්‍ර සූත්‍ර, උපකරණ, මෙවලම් හා සැපයුම් .. .. .. | 13 | 11,915 | 136 | 172 | 11 | 53 | 372 |
| XIV. යන්ත්‍ර සූත්‍ර (විදුලි යන්ත්‍රෝපකරණ හැර) සහ ප්‍රවාහණ උපකරණ .. .. | 14 | 11,262 | 120 | 44 | 31 | 50 | 245 |
| XVII. සකස්කළ නිෂ්පාදිත (වෙනත් තැනක නොසඳහන්) .. .. .. | 20 | 4,737 | 51 | — | 10 | ... | 61 |
| XVIII. ද්‍රව නිෂ්පාදිත .. .. .. | 4 | 1,148 | 16 | — | 3 | — | 19 |
| XIX. ලෝහ නොවන ඛනිජ නිෂ්පාදිත සහ පැට්‍රෝලියම් සහ ගල් අඟුරු නිෂ්පාදිත .. .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| XX. පිහන් බඩු .. .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| XXI. තුනී ලෑලි .. .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| XXI . ඛණිජ වැලි .. .. .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| XXIII. මූලික කාර්මික රසායන ද්‍රව්‍ය .. | | | ලබා ගැනීමට නොමැත | | | | |
| XXIV. සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස් නිෂ්පාදිත .. .. | 5 | 48,603 | 2,393 | — | 2,867 | — | 5,260 |
| එකතුව .. .. .. | 326 | 282,477 | 5,678 | 658 | 3,607 | 648 | 10,591 |

ගණයෙහි වැටුප් බිල 1966 දී රුපියල් දශලක්ෂ 5·4 සිට රුපියල් දශලක්ෂ 13·3 දක්වා වැඩි වුණු අතර, **සිමෙන්ති, සිමෙන්ති නිෂ්පාදිත සහ ඇස්බැස්ටෝස්** ගණයෙහි වැටුප් බිල රුපියල් දශලක්ෂ 4 සිට 6·3 දක්වා වැඩි විණි. අනෙක් කර්මාන්ත ගණවල වැටුප් බිලෙහි වෙනස්වීම් අල්ප විය.

මිනිස් දිනකට වැටුප රුපියල් 6·04 සිට රුපියල් 6·62 දක්වා වැඩි වුණි. ඒ ඒ කර්මාන්ත ගණ වල මිනිස් දිනක වැටුප් මට්ටම් වල සාපේක්ෂ අසමාන කම පෙනෙයි. **විවිධ රසායනික නිෂ්පාදන ගණයෙහි**, මිනිස් දිනකට වැටුප රුපියල් 9·75 ක් වූ අතර **විස්කෝතු සහ කොකෝවා, චොක්ලට් සහ රස කැවිලි** ගණයෙහි මිනිස් දිනකට වැටුප වූයේ රුපියල් 3·59 ක් පමණි. කර්මාන්ත බොහෝ ගණනක මිනිස් දිනකට වැටුප ඉහළ ගියේය. **විවිධ ආහාර නිෂ්පාදන** ගණයෙහි මිනිස් දිනකට වැටුප රුපියල් 5·13 සිට රුපියල් 7·11 දක්වා ඉහළ යෑම උදාහරණයකි. එහෙත්, මිනිස් දිනකට වැටුප පහළ වැටුන කර්මාන්ත කිහිපයක්ද විය. ඒවා මෙසේ වීය. **විස්කෝතු සහ කොකෝවා, චොක්ලට් සහ රස කැවිලි ගණයෙහි**, රුපියල් 3·67 සිට රුපියල් 3·59 දක්වා ද, පාවහන් හා සම්භාණ්ඩ ගණයෙහි රුපියල් 8·44 සිට රුපියල් 8.25 දක්වා ද, **විදුලි යන්ත්‍ර සූත්‍ර උපකරණ මෙවලම් සහ සැපයුම්** රුපියල් 9·25 සිට රුපියල් 6·87 දක්වාද වශයෙනි. පොදු අංශයේ කර්මාන්ත ආයතන සාමාන්‍ය වශයෙන් මිනිස් දිනකට වැඩි වැටුපක් ගෙවා ඇත. උදාහරණ වශයෙන් පිඟන් බඩු, තුනී ලෑලි, සහ ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය විසින් මිනිස් දිනකට වැඩිම වැටුප් ගෙවීම දක්විය හැකිය.

**තාප ඉන්ධන**

තාප සහ ඉන්ධන යෙදීම 2 (ආ) 7 වැනි සංඛ්‍යා සටහනින් දක්වෙයි. ව්‍යාපාර ආයතන විශාල සංඛ්‍යාවක් තාප යෙදවීම සම්බන්ධව, තොරතුරු සපයා නොමැත ව්‍යාපාර ආයතන 1830 ක් විසින් නිෂ්පාදන තොරතුරු සපයා ඇති අතර, තාප හා ඉන්ධන යෙදවීම පිළිබඳව තොරතුරු සපයා ඇත්තේ 326 ක් පමණි. ප්‍රධාන තාප ලබා ගන්නා ලද්දේ විදුලි බලයෙනි. පිළිතුරු සැපයූ ව්‍යාපාර ආයතන මගින් පාවිච්චි කරන ලද විදුලි බලයේ වටිනාකම රුපියල් දශ ලක්ෂ 5·7 ක් ද, පැට්‍රල් සහ තෙල්වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 3·6 ක්ද රට අඟුරු හා ගෑස් වල වටිනාකම රුපියල් දශ ලක්ෂ 0·7 ක් ද විය.

1967 දී කාර්මික නිෂ්පාදනයේ වටනාකම 1966 දීට වඩා වැඩි විය. මෙය හැකි-වූයේ කර්මාන්ත සඳහා දෙන ලද විනිමය වෙන් කිරීම් වැඩිවීම නිසාය. කාර්මික අංශයට තවදුරටත් නිමයුම පුළුල් කිරීමට ඉඩ ඇතත් එය වැළකී ඇත්තේ අමු ද්‍රව්‍ය, ආනයනය කිරීමට විදේශීය විනිමය සීමිත වීම නිසාය.

# (ආ) රාජ්‍ය අංශයේ කර්මාන්ත

**සාමාන්‍ය**

පසුගිය වර්ෂය අවසානයේ පැවැති කර්මාන්ත අංශයේ රාජ්‍ය සංස්ථා ගණන වන 21, 1967 අවසානයේදී ද එසේම පැවතුනි. මෙයින් සතරක්, තවම නිෂ්පාදනය ආරම්භ කොට නැත. ඒවා නම්, රාජ්‍ය පිටි ඇඹරුම් සංසථාව, රාජ්‍ය පොහොර නිෂ්-පාදනය සංස්ථාව, ජාතික කිරි මණ්ඩලය (උකු කිරි කම්හල) හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව (තෙල් ශුද්ධ කිරීමේ කම්හල) යන ඒවාය. මෙහි අවසානයේ දැක්වූ සංස්ථා දෙක ප්‍රථමයෙන් පිහිටුවූයේ, පිළිවෙලින් කිරි හා ඛණිජ තෙල් බෙදා හැරීමේ කටයුතු සඳහා වුවද, 1966 වර්ෂයේදී එම සංස්ථා මගින් නිෂ්පාදන කිරීමේ කර්මාන්තශාලා පිහිටුවීමටද පියවර ගෙන ඇත.

විවිධ රාජ්‍ය කර්මාන්ත සංස්ථාවල මුළු ධාරිතාව, නිමැවුම හා විකුණුම් (ප්‍රමාණය) II (ආ) 8 සහ II (ආ) 9 යන සංඛ්‍යා සටහන්වල දක්වා ඇත. වැඩ ආරම්භ කර ඇති කර්මාන්ත 17 අතුරින් 10 ක්, ඒවායේ ප්‍රධාන නිෂ්පාදනවල උසස් මට්ටමක් ඉකුත් වර්ෂයේදීට වඩා 1967 දී පෙන්විය. කෙසේ වෙතත් කර්මාන්ත වැඩි හරියක් ධාරිතා ප්‍රමාණයට අඩුවෙන් මේ අවුරුද්දේ ද කටයුතු කොට ඇත.

**නැගෙනහිර කඩදාසි සංයුක්ත මණ්ඩලය**

පෙර වර්ෂයට වඩා දියුණු ලෙස කටයුතු කොට, 1966 වර්ෂයේ නිමැවුමෙහි සියුම් වැඩිවීමක් දැක්වූ නැගෙනහිර කඩදාසි කර්මාන්ත සංයුක්ත මණ්ඩලය (පිදුරු වලින් කඩදාසි නිෂ්පාදනය කරන) 1967 වර්ෂයේ දී ද නිමැවුම උසස් මට්ටමකින් පවත්වා-ගෙන යාමට සමත් වී ඇත. 1965 සිට, කම්හල දිනකට වැඩ මුර 3 ක් ක්‍රියාත්මක කොට ඇත. ධාරිතාව උපයෝගි කොට ගැන්ම, 1966 වර්ෂයේ සියයට 91 සිට 1967 වර්ෂයේදී සියයට 95 දක්වා වැඩි කොට ඇත. 1967 වර්ෂයේ නිෂ්පාදනය සියයට 4·6 ක වැඩිවීමක් වුවද, විකුණුම් 1966 මට්ටමට වඩා සියයට 31 කින් පහළ වැටිණි.

ප්‍රධාන වශයෙන්ම පාසල් පොත් මුද්‍රණය රජයට පවරා ගැනීම හේතු කොට ගෙන පෞද්ගලික අංශයේ මුද්‍රණ කටයුතු සැලකිය යුතු ලෙස අඩුවීමෙන්, සංයුක්ත මණ්ඩලයට නිෂ්පාදිත අලෙවි කිරීම් දුෂ්කරතා ඇති විය. පෞද්ගලික, අංශයේ ඉල්ලුම අඩුවන විට, විශේෂයෙන්ම මුද්‍රණ කඩදාසි වල විකුණුම් අඩුවෙයි. සංයුක්ත මණ්ඩලය ප්‍රධාන වශයෙන් මුද්‍රණ හා ලියන කඩදාසි නිෂ්පාදනය කරන නිසා ඒවායේ අලෙවිය අඩුවීම, 1966 වර්ෂයේ ලැබූ රුපියල් දශ ලක්ෂ 17·2 ක්වූ විකුණුම් අදායම, 1967දී රුපියල් දශ ලක්ෂ 15·3 දක්වා පහත වැටීමට හේතු විය. එසේම, වර්ෂය අවසානයේදී නොවිකුණු කඩදාසි තොගය ටොන් 5751 කින් වැඩිවීමටද හේතු විය. විවිධ ඍජු උපයෝගිකරුවන් නොනවත්වා කළ ආනයන, ප්‍රශ්න උග්‍ර කිරීමට තුඩු දුන් අතර, දැනට ඇති අඩු සැපයුම්, දේශීය වෙළෙඳ පොළෙහි දී පාරිභෝජනය කළ විට, අනාගතයේදී මෙම දුෂ්කරතා ඉවත්ම විසඳේ යයි බලාපොරොත්තු වෙයි.

විකුණුම් ආදායම අඩුවීම, සිදුවූයේ වියදම ඉහළ යන ගමන්ය; ප්‍රධාන වශයෙන් නැව් ගාස්තු වැඩිවීම හා ආනයන බලපත්‍ර ගාස්තු වැඩිවීමේ (සංස්ථාව, ආනයන කළ දැව පල්ප හා ඉන්දන පාවිච්චි කරයි) ප්‍රතිඵලයක් වශයෙන්, 1966 රුපියල් දශ ලක්ෂ 3·4 ක්වූ ලාභය, 1967 වර්ෂයේ රුපියල් දශ ලක්ෂ 3·2 දක්වා පහළ වැටුණි.

මෙම සංස්ථාව විසින්, වාලච්චේනෙහි දිනට කම්හල පවත්නා ස්ථානයේ, ඝන කඩදාසි කම්හලක් ගොඩනැගීමේ මූලික වැඩ කටයුතු 1967 වර්ෂයේ අවසන් කරන ලදී. ජර්මන් ෆෙඩරල් සමූහාණ්ඩුවෙන් ලබා ගත් ඩොයිෂ් මාර්ක් දශ ලක්ෂ 14 මගින් මෙයට මුදල් යෙදවෙයි. කම්හලේ වාර්ෂික ධාරිතාව ටොන් 12,000 ක් වන අතර, 1970 ජූනි මාසයේදී නිෂ්පාදන කටයුතු ඇරඹීමට බලාපොරොත්තු වේ. අම්බලන්තොට, දෙවැනි කඩදාසි කම්හල සඳහා ප්‍රාරම්භ පරීක්ෂණ කටයුතුඅවසන් කොට ඇත.

## ලංකා පිගන් බඩු සංයුක්ත මණ්ඩලය

ලංකා පිගන් බඩු සංයුක්ත මණ්ඩලයේ නිමැවුම, 1966 වර්ෂයේ ටොන් 813 සිට 1967 වර්ෂයේදී ටොන් 1956 දක්වා වැඩි විය. නිමැවුම වැඩි වූයේ ප්‍රධාන වශයෙන් ම, ටොන් 1038 ක් නිපදවූ, පිළියන්දල පිහිටි නව කම්හල නිෂ්පාදන කටයුතු ඇරඹීමත් සමග වූ අතර, මීගමුවේ පිහිටි පැරණි කම්හලේ නිමැවුමද, ටොන් 105 කින් පමණ ඉහළ ගියේය. මීගමුවේ කම්හල දිගටම ධාරිතාවට ආසන් නව කටයුතු කොට ඇති අතර, පිගන් බඩු ටොන් 2400 ක ධාරිතාවක් ඇති නව කම්හල, ධාරිතාවෙන් සියයට 47 කින් කටයුතු කොට ඇත.

ආනයන සීමාකිරීම් නිසා, එහි නිමැවුමට ඇති ඉල්ලුම සැපයුමට වඩා නිතරම ඉහළින්වූ අතර, සංස්ථාවට විකුණුම් සලාක කිරීමට ද සිදු විය. ලාභ, 1966 මට්ටම මෙන් තෙගුණයක් පමණ විය. ධාරිතාවට අඩු මට්ටමකින් කටයුතු කළ පිළියන්දල කම්හලෙන් 1967 දී ලාභ වලින් සියයට 55 ක් පමණ ලැබිණි. මුළු ලාභයෙන් මීගමුවේ පැරණි කම්හලේ කොටස, සියයට 41 ක් වූ අතර, කිරිමැටි ශුද්ධ කිරීමේ කම්හලේ ලාභය, මුළු ලාභයෙන් සියයට 4 ක් විය. ඉකුත් වර්ෂයේදී මෙන්ම ආයෝජන ප්‍රාග්ධනය, 1967 දී ද නොවෙනස්ව පැවති නමුත්, ප්‍රාග්ධනයේ ඵලදා අනුපාතිකය, 1966 වර්ෂයේ සියයට 3·1 සිට, 1967 වර්ෂයේ සියයට 9·1 දක්වා වැඩි විය.

පිගන් බඩු සංයුක්ත මණ්ඩලයේ, මීගමුවේ පිහිටි කම්හල පුළුල් කිරීමේ කටයුතු, 1967 වර්ෂයේ ආරම්භ කරන ලදී. මෙම ව්‍යාපාරයෙන් වර්ෂික ධාරිතාව ටොන් 160 කින් වැඩි කිරීමට බලාපොරොත්තු වන අතර, ආරක්ෂක උපකරණ නිෂ්පාදන-යද ව්‍යාපාරයට ඇතුළත් වෙයි.

## ලංකා තුනී ලෑලි සංස්ථාව

1966 වර්ෂයේ ධාරිතාව සැහෙන තරමින් පුළුල් කිරීමෙන් පසු, ලංකා තුනී ලෑලි සංස්ථාව එහි නිමැවුම සැලකිය යුතු ලෙස වැඩි කළ නමුත්, 1967 වර්ෂයේ තේ පෙට්ටි, බැටන් සහ බෝඩ් නිෂ්පාදනය සැහෙන තරමින් අඩුවීමෙන්, පසු බැසීමක් පෙන්වා ඇත. සමහර අවස්ථාවල දිනකට වැඩි මුර 3 ක් ක්‍රියාත්මක කළද, නිෂ්පාද-නය, ධාරිතාවට ඉතාම අඩු විය. මෙයට ප්‍රධාන වශයෙන් හේතුවූයේ දැව හිඟයයි. මෙසේ වූයේ, කාලගුණ තත්ත්වය වෙනස් වීම අනුව, කැලෑ දෙපාර්තමේන්තුවෙන් දැව සැපයීම ද අක්‍රමවත්වීම නිසාය. සේවකයන් අතර කලක සිට පැවති වැඩට නො-පැමිණීමේ දුෂ්කරතාව ද, මෙයට තරමක් දුරට බලපෑවේය. සේවකයන්ගේ මෙම පුරුද්දට හේතුව, ඔවුන් වඩාත් ලාභ ගෙන දෙන කාර්යයන් සඳහා පිටස්තර සේවාවලට යාමයි. විශේෂයෙන්ම වී ගොවිතැන් කරන හා අස්වැන්න කපන කාලයට මෙය සිදුවේ. සංස්ථාව විසින් වැඩට නොපැමිණෙන අයගේ දිනක මූලික වැටුප අඩු කිරීම මෙතෙක් කළද, දැන් දිනක දළ වැටුප අඩු කිරීමට තීරණය කොට ඇත. සේවකයකුගේ දළ ලැබීම්, මූලික ලැබීම්වලට බොහෝ වැඩි නිසා, එම පියවර වැඩට නොපැමිණීමේ දුෂ්කරතාව සැහෙන තරමකින් අඩු කිරීමට සමත් විය හැකිය.

තුනී ලෑලි සංස්ථාවේ 1967 විකුණුම් ආදායම ඉකුත් වර්ෂයට වඩා සියයට 7·2 කින් වැඩි වූ අතර, නිමැවුම ටොන් 1119 කින් අඩු වුවත්, එහි ලාභය රුපියල් 420,000 සිට රුපියල් 5,42,009 දක්වා වැඩිවිය. තේ පෙට්ටි හා ප්ලයිබෝඩ් විකුණුම් තියුණු ලෙස අඩුවූ අතර බැවින්, දොරවල් හා වෙනත් නිෂ්පපාදන වල විකුණුම වැඩි විය. ඇත්තවශයෙන්ම, 1967 වර්ෂයේ දොරවල් සඳහා ඉල්ලුම, සැපයුම ඉක්මවූ අතර, විකුණුම් සලාක කිරීමට ද සිදුවිය. සංස්ථාව ලංකාවට අවශ්‍ය තේ පෙට්ටි ප්‍රමාණයෙන් සියයට 25 ක් පමණ සපයන අතර, සංස්ථාවේ නිමැවුම අනුව ආනයන සකස් කරන නිසා, විකුණුම් දුෂ්කරතාවන්ට මුහුණ නොපායි. ඔප දැමූ ලී, කලුලෑලි, දොරවල් හා වෙනත් වාණිජමය ශ්‍රෙණිවල තුනී ලෑලි තහනම නිසා සංස්ථාවේ මෙම නිෂ්පාදනයන්ට ද අරක්ෂිත වෙළෙඳ පොළක් ඇත. අනික් අතට, 1967 වර්ෂයේ වියදම්, ප්‍රධාන වශයෙන් වැටුප් වැඩි කිරීම නිසා, ඉහළ යන උපනතියක් පෙන්විය.

**ලංකා තෙල් හා මේද සංයුක්ත මණ්ඩලය**

සත්ව හා කුකුල් ආහාර සහ පොල් වලින් සැදූ කෑම නිෂ්පාදනයෙහි තව දුරටත් යෙදුණු ලංකා තෙල් සහ මේද සංයුක්ත මණ්ඩලයේ, 1965 වර්ෂයේ පැවති ටොන් 33,452 ක නිෂ්පාදනය, 1967 වර්ෂයේදී, ටොන් 43, 206 දක්වා වැඩිවිය. 1966 වර්ෂයේ මඳක් වැඩිවූ පොල් තෙල් නිෂ්පාදනය, මෙම වර්ෂයේදී ඉකුත් වර්ෂයේ මට්ටමට අඩක් වන තරමට පහත බස්සේය. පොදුවේ බලතොත්, පොල් තෙල් නිෂ්පාදනය ධාරිතාවට ඉතා අඩුවූ නමුත්, සත්ව ආහර නිෂ්පාදනයෙහිදී, කම්හල පූර්ණ ධාරිතාවට සියයට 33 ක් පමණ ඉහළින් කටයුතු කළේය. සංස්ථාව රුපියල් 145, 689 ක් වටිනා මේද අම්ල ටොන් 97 ක්, 1967 වර්ෂයේ අපනයනය කරන ලදී.

**ලංකා සම්භාණ්ඩ සංයුක්ත මණ්ඩලය**

සංස්ථාවේ සපත්තු නිෂ්පාදන ධාරිතාව 1967 දී, වර්ෂයකට සියයකට 25 ගණනේ වැඩි කරන ලදී. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් නිමැවුම, සපත්තු කුට්ටම 2,24,000 සිට 2,51,000 දක්වා හෙවත්, සියයට 11·6කින් වැඩි විය. ක්‍රෝම් සම් නිෂ්පාදනය ස්වල්ප වශයෙන් අඩු වුවද, වෙනත් සම් නිෂ්පාදිතවල වැඩිවීමක් විය. නිෂ්පාදනය පෙර වර්ෂයේ මෙන්ම පූර්ණධාරිතාවෙන් යුක්ත විය. විකුණුම්ද, නිමැවුම් මට්ටම අනුවම පැවතියේය.

1967 වර්ෂයේ සංස්ථාවේ විකුණුම් ආදායම රුපියල් දශ ලක්ෂ 5·4 ක්වූ අතර, මින් රුපියල් දශ ලක්ෂ 4·9 ක් හෙවත් සියයට 91 ක්, සපත්තු විකුණුමෙන් ලබා ගන්නා ලදී. ඒහි විකුණුම් වලදී, විශාල නිෂ්පාදන ආයතන 4 ක් සහ සුළු සපත්තු නිෂ්පාදකයන් රාශියක් සමග තියුණු තරඟයක් කිරීමට සිදු විය.

රජයේ නියෝග මත ලබාදුන් වැටුප් වැඩි කිරීම නිසා, 1967 වර්ෂයේ වියදම් පොදුවේ වැඩිවිය. කෙසේ වෙතත්, පසුගිය වර්ෂයේ ඉහල අලෙවි මට්ටම නිසා, 1967 වර්ෂයේ දී සංස්ථාවේ ලාභය 1966 මෙන් දෙගුණයකට කිට්ටු විය. එය, ආයෝජිත ප්‍රාග්ධනයෙන් සියයට 4·4 ක් පමණ විය. සංස්ථාව රුපියල් 52,000 ක් වටිනා සපත්තු කුට්ටම් 2000 ක්, 1967 දී සෝ. ස. ස. සං. යට අපනයනය කරන ලදී.

නව පන්නයක සපත්තු නිෂ්පාදනයක් (සම් ඇලවීමෙන්) 1967 දී අරඹන ලදී. බලාපොරොත්තු වූ පරිදි, සම් පදම් කිරීමේ කම්හල පුළුල් කිරීමේ කටයුතු පසුගිය වර්ෂයේ සිදු නොවූයේ සැලැස්ම සඳහා රජයේ අනුමැතිය බලාපොරොත්තුව සිටින නිසාය. 1967 සපත්තු අපනයන කොට ලැබූ අත්දැකීම් නිසා, අනාගතයේදී නිරන්තරයෙන් අපනයන කටයුතුවල යෙදීමට සංස්ථාව බලාපොරොත්තු වේ.

**පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලය**

1967 වර්ෂයේ කෝස්ටික් සෝඩා නිෂ්පාදනය ආන්තික වශයෙන් අඩුවූ අතර ක්ලෝරීන් හා ලුණු කුඩු, නිෂ්පාදනය කිරීම වැඩි විය. සංස්ථාව, ශුද්ධ නොකළ ලුණු වලින් කෝස්ටික් සෝඩා, ක්ලෝරීන් වායුව හා ජලකර වායුව නිපදවයි. කෝස්ටික් සෝඩා සඳහා සකස්වූ වෙළෙඳ පොලක් පැවතීමෙන්, (සංස්ථාව දැනට ලංකාවට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 30 ක් පමණ නිපදවයි) ක්ලෝරීන් එසේ විකිණිය නොහැකිය. මෙසේ අතිරික්ත ක්ලෝරීන් ප්‍රමාණයෙන් මිදීමට සංස්ථාවට ඇති හැකියාව, (දැනට එය බඳු දී ඇත ) අනිකුත් රසායන ද්‍රව්‍යවල නිමැවුම තීරණය කරයි. ලංකාවේ ක්ලෝරීන් වලට ඇති ඉල්ලුම සෙමෙන් පුළුල්වන හෙයින්, සංස්ථාව, ධාරිතාවටත් වඩා අඩුවෙන් කටයුතු කොට ඇත. එහෙත්, ඉල්ලුමෙහි ක්‍රමික වැඩිවීම නිසා, පසුගිය වර්ෂ කීපය තුළ ධාරිතා උපයෝගිතා සලාකය දියුණු වෙමින් පැවතිණි. ඒ අතර සංස්ථාව, ශුද්ධකළ ලුණු කුඩු නම් තවත් අමතර නිෂ්පාදනයක නිමැවුම වැඩිකොට ඇත.

පසුගිය වර්ෂ 5 තුල ස්ථාවර ලෙස වැඩිවූ සංස්ථාවේ ආදායම 1967 වර්ෂයේ දී ආන්තික ලෙස වැඩි විය. මෙයට හේතුව කෝස්ටික් සෝඩා සහ ලුණු කුඩු ආදායමෙහි තිබුණු අඩුවීම, 1967 වර්ෂයේ ක්ලෝරීන්වලින් ලැබූ වැඩි ආදායම මගින් පිරිමැසීමයි. මෙම ව්‍යවසායේ මූල්‍ය අස්ථිරත්වයට, ප්‍රධාන වන්නේ, ක්ලෝරීන් විකිණීමේ හැකියාව යන අදහස මින් දක්වයි වැඩිවූ වැටුප් සහ ලුණු අමුද්‍රව්‍ය සඳහා ගෙවූ වැඩිමිල, මගින් වර්ෂය තුලදී වියදම් ඉහල නැංවිය. 1967 මිල සංශෝධන යක් නොවීය. සංස්ථාවේ සියලුම කටයුතු වලින් 1967 රුපියල් 3,89,466 ක ලාභ යක් වාර්තාගත වී ඇත. මෙය පෙර වර්ෂය මෙන් දෙගුණයකටද අධිකය.

පරන්තන් රසායන ද්‍රව්‍ය සංයුක්ත මණ්ඩලයේ නව හයිඩ්‍රෝක්ලෝරික් අම්ල නිපදවීමේ කම්හල සම්පූර්ණ කොට ඇති අතර, එය 1968 නිෂ්පාදනය අරඹනු ඇත. ක්ලෝරීන් ටොන් 400 ක් පමණ පාවිච්චි කරන මෙම කම්හල නිසා සංස්ථාවේ. අතිරික්ත ක්ලෝරීන් පිළිබඳ බලවත් ප්‍රශ්ණය තරමක් දුරට මගහැරෙයි. 1967 වර්ෂයේදී සංස්ථාව පොටෑසියම් නිෂ්පාදනය කිරීමට සකස් කළ කම්හළ දැනට නිෂ්පාදන අත්හදා බැලීමේ අවස්ථාවේ පවතී. ඇමෝනියම් ක්ලෝරයිඩ් සහ සෝඩා නිෂ්පාදන හැකියාව පිළිබඳවද පරීක්ෂණ පවත්වා ඇත.

**සිමෙන්ති සංයුක්ත මණ්ඩලය**

කන්කසන්තුරේ සිමෙන්ති කම්හලේ ආරම්භක වර්ෂයවූ 1950 සිට, එහි ධාරිතාව ප්‍රසාරණය නොකළ සිමෙන්ති සංස්ථාව, එම ස්ථානයෙහිම තවත් කර්මාන්ත ශාලාවක් ගොඩනගා, 1966 වර්ෂයේ තවත් පියවරක් ඉදිරියට තැබිය. එම අවස්ථාවේම ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වසාදමූ පැරණි සිමෙන්ති කම්හල, 1967 වර්ෂයේ දී ද නිෂ්පාදනය සඳහා සකස් කොට නොතිබුණි. 1966 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමේ දී මුහුණ පෑ මූලික දුෂ්කරතා සාර්ථක ලෙස අවසන්කළ, වාර්ෂික පූර්ණ ධාරිතාව ටොන් 1,65,000 ක්වූ නව සිමෙන්ති කම්හල, 1967 වර්ෂයේදී ධාරිතාවෙන් සියයට 92 ක ප්‍රමාණයකට ක්‍රියාත්මක කළේය. මෙසේ 1967 වර්ෂයේ කන්කසන්තුරේ ඒකකයේ, වර්තාගත නිමැවුම, 1966 වර්ෂයේ නිමැවුම මෙන් දෙගුණයකට ආසන්න වෙයි. වාර්ෂික ධාරිතාව ටොන් 100,000 ක්වූ ගාල්ලේ රුහුණු සිමෙන්ති කම්හලද, 1967 වර්ෂයේදී කටයුතු ආරම්භ කළේය. මුල් සැලැස්ම වූයේ සිමෙන්ති ගල් කන්කසන්තුරේ සිට මුහුදින් ගෙනවුත් ගාල්ලෙන් ගොඩබෑමටය. නමුත් කන්කසන්තුරේ වරාය පහසුකම අඩු නිසා, (ගොඩබිමින් සිමෙන්ති ගල් ගෙනයාමේ වියදම අනාර්ථිකය) අවශ්‍ය කරන සිමෙන්ති ගල් ආනයන කිරීමට තීරණය කළේය. කෙසේ වෙතත්, ලෝක වෙළෙඳ පොලෙහි පවත්නා සිමෙන්ති මිගය, එහි වැඩපිළිවෙල, ධාරිතාවෙන් තුනෙන් පංගුවක් දක්වා අඩුකළේය.

විකුණුම් ආදායම පෙර වර්ෂයට වඩා දෙගුණයකටද වැඩිය. දේශීය සිමෙන්ති ඉල්ලුමෙන් සියයට 50 පමණ වන දේශීය නිෂ්පාදනයේ ඒකාධිකාරය සංස්ථාවට තිබිණි. රටේ ඉතිරි අවශ්‍යතා සඳහා සමුපකාර තොග වෙළෙඳ සංස්ථාව විසින් සිමෙන්ති ආනයනය කරන ලදී. කන්කසන්තුරේ කම්හලෙහි නිෂ්පාදිත වියදම් 1966 වර්ෂයේ ටොන් එකක් රුපියල් 114·62 සිට 1967 වර්ෂයේ රුපියල් 108·59 දක්වා අඩුවූයේ, 1967 නොවැම්බර් තෙක් විශාල වශයෙන් නව කම්හලෙහි පරිමාන පිරිමැසුම් නිසයි. කෙසේ වෙතත්, නොවැම්බර් මස රුපියලේ වටිනාකම අවප්‍රමාණ කිරීමේ සිට, ඉන්දන හා වෙනත් ආනයන ශීර්ෂවලට ගෙවූ අධික මිල නිසා, සාමාන්‍ය වියදම ටොන් එකකට රුපියල් 123·41 දක්වා වැඩි විය. අනික් අතට, සිමෙන්ති ගල් ආනයනය කළ, ගාල්ලේ සිමෙන්තිවල සාමාන්‍ය වියදම වඩාත් වැඩි වූයේ ටොන් එකක් රුපියල් 214·99 ක් (අවප්‍රමාණයට පසු මිල) විය. ඇත්තෙන්ම, සිමෙන්ති ගල්වලට පමණක් පැහැදම, ටොන් එකකට රුපියල් 159·72 ක් වියදම් වූයෙන්, කන්කසන්තුරේ අවසන් කළ සිමෙන්ති වල සාමාන්‍ය වියදම වලටද වැඩි විය. සිමෙන්ති ගල් ටොන් එකක මි ර. ගැ. මිල සංස්ථාවට රුපියල් 93·00 ක් විය. කන්කසන්තුරේ සිමෙන්ති ටොන් එකක සිල්ලර මිල 1967 පෙබරවාරි මස රුපියල් 190 සිට 180 දක්වා අඩු කළ අතර, රුහුණු සිමෙන්ති (ගාල්ලේ) ටොන් එකක මිල 1967 අප්‍රේල් මස රුපියල් 220 සිට රුපියල් 210/- දක්වා අඩු කළේය. මේ දක්වා උසස් පිරිවැටුම මත, 1966 රුපියල් දශ ලක්‍ෂ 2·5 ක්වූ (බදු ගෙවීමට පසු) ලාභය, 1967 වර්ෂයේදී රුපියල් දශ ලක්‍ෂ 13·0 දක්වා (බදු ගෙවීමට පෙර) වැඩි කිරීමට සංස්ථාව සමත් විය. බදු ගෙවීම සඳහා ප්‍රතිභාග වෙන්කළ විට, ලාභයේ වැඩිවීම මෙයට වඩා අඩුය. 1967 වර්ෂයේ ලාභය (බදු ගෙවීමට පෙර) මුළු ප්‍රාග්ධන ආයෝජන වලින් 9% ක් වේ.

කන්කසන්තුරේ පැරණි කම්හල නව ස්වරූප ගැන්වීමේ කටයුතු, 1968 වර්ෂයේ සම්පූර්ණ කරනු ඇත. මෙම කම්හලෙන් අමතර නිෂ්පාදනය, වාර්ෂිකව සිමෙන්ති ටොන් 110,000 ක් බලාපොරොත්තුවේ. ඒ අතර, 1969 කටයුතු අවසන් කළ පසු, තවත් සිමෙන්ති ටොන් 220, 000 ක් නිශ්පාදන කිරීමට බලාපොරොත්තු වන, පුත්තලම් සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම පියවරහි කටයුතුද කෙරනි. ඒ අතර, අමතර කම්හලක් මගින් තවත් සිමෙන්ති ටොන් 220,000 ක් නිෂ්පාදනය කළ හැකි පුත්තලම් ව්‍යාපාරයේ, දෙවන පියවරද සැලසුම් අවස්ථාවෙහි ඇත. කන්කසන්තුරේ සිට ගාල්ලේ ඇඹරුම් කම්හල දක්වා සිමෙන්ති ගල් ගෙන යාමට ගාල්ලේ සහ කන්කසන්තුරේ වරාය පහසුකම් දියුණු කරනතුරු ප්‍රමාද වීමට සිදු වෙයි.

## ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය

ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලය, ලී භාණ්ඩ, ගඩොල් උළු සහ ආයුර්වේද ඖෂධ ආදියෙහි වර්ග කිහිපයක්ම නිපදවයි. එමගින් නිපදවන ලද ලී භාණ්ඩවල වටිනාකම, 1967 දීද ඉකුත් වර්ෂයේදී මෙන්, ආන්තික ලෙස වැඩි වී ඇත. නව කර්මාන්තශාලාවල නිෂ්පාදනය පටන් ගැනීමත් සමගම, සංයුක්ත මණ්ඩලයේ උළු සහ ගඩොල් නිමැවුම සැලකියයුතු ලෙස වැඩිවිනි. එහෙත් මිලෙහි සාපේක්ෂ වාසිය, දේශීය ඇස්බෙස්ටෝස් තහඩු කර්මාන්තයට හිමිවූයෙන්, අලෙවි කිරීමේ අමාරුකම් හේතු කොට ගෙන, සමහර අවස්ථාවලදී නිෂ්පාදනය අඩු කිරීමට සිදු විනි. එහෙත්, ඇස්බෙස්ටෝස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමු ද්‍රව්‍ය ආනයනය අඩු කිරීමත් සමගම, 1967පසු භාගය වන විට, සංයුක්ත මණ්ඩලයේ අලෙවි කිරීම් සහ සහ නිපෂ්ාදනය සීඝ්‍ර ලෙස දියුණු විය. ඖෂධ නිෂ්පාදනයෙහිද දියුණුවක් දක්විනි.

ජාතික සුළු කර්මාන්ත සංයුක්ත මණ්ඩලයේ විකුණුම් අය භාරයෙහි, 1963 දී දී සිට පැවත ආ වැඩිවීමේ ප්‍රවනතාවය, 1967 දී ද දක්විනි. මෙයට හේතු වී ඇත්තේ, ගඩොල් සහ උළුනිෂ්පාදනයෙන් ලද ඉපයීම්වල පිරිහීම, පමණටත් වඩා මකාලිය හැකිවූ, වැඩි අයභාරයක් ලී භාණ්ඩ සහ උළු නිෂ්පාදනයෙන් ලැබීමත්, සංයුක්ත මණ්ඩලය මගින් නිෂ්පාදිත උළු ඉතා ඉස්තරම් වර්ගයට අයත් වුවද, ඇස්බෙස්ටෝස් සෙවිලි සාපේක්ෂ ලෙස ලාභ වූයෙන්, ඒවා විකිණීමට අපහසු විය. එහෙත්, ඉකුත් වර්ෂයේ අවසානය වන විට, ඇස්බෙස්ටෝස් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය අනයන අඩු කිරීමත් සමගම, උළු අලෙවිකිරීමේ හැකියාව වැඩි විය නිෂ්පාදිත වියදම් වැඩිවීමට මූලික වශයෙන් හේතුවී ඇත්තේ, රජයේ නිර්දේශයක් කරණකොට ගෙන, වැටුප් වියදම් වැඩිවීමය ලී භාණ්ඩ නිෂ්පාදන අංශය පෙරසේම පාඩු විඳිමින් පවත්වාගෙන ආ අතර ගඩොල් සහ උළු අංශයන් හි නිෂ්පාදනයෙන්ද 1967 දී පාඩු සිදුවී ඇත. ඔඉඳ අංශයෙන් ලද ලාභයෙන් මෙය තරමක් දුරට මැකී ගිය අතර, මුළු හිඟය රුපියල් 9, 26,000 ක් විය. මෙය 1966 අලාභයට වඩා සියයට 15·8 කින් වැඩි හිඟයකි. ඇත්ත වශයෙන්ම, වඩුකාර්මිකයින් සමූහයකට රැකියා සහනාධාරයක් වශයෙන් සංයුක්ත මණ්ඩලය මගින් ලී භාණ්ඩ අංශය පවත්වාගෙන යන බව මෙහි සඳහන් කළ යුතුය. වඩා හොඳ ක්‍රම අනුගමනය කරමින් නිෂ්පාදනය තර්කාන්විත පදනමකට ගෙන ඒමට, බාධා තෙරෙනුයේ මෙයයි.

## ජාතික ලුණු සංයුක්ත මණ්ඩලය

ලංකාවේ ලුණු නිෂ්පාදනය කෙරෙනුයේ, සූර්‍ය රශ්මියෙන් සහ සුළඟින් මුහුදු වතුර වාෂ්පීකරනය වීම ආධාර කොට ගෙනය. 1966 ජූලි මාසය තෙක් ලංකාවේ ප්‍රධාන ලුණු ලේවා 15 ක් පාලනය කරන ලද්දේ රජයටම අයත් වූ බලය ලත් ආයතන දෙකක් මගිනි එනම්, උතුරු සහ බස්නාහිර කලාපවල ලුණු ලේවා 11 ක් රජයේ ලුණු දෙපාර්තමේන්තුව විසින් පාලනය කර ඇති අතර, දකුණු කලාපයේ ලුණු ලේවා 4 ක් ජාතික ලුණු සංයුක්ත මණ්ඩලය යටතේ පැවතුනි. 1966 ජූලි මාසයේ දී සියළුම ලුණු ලේවා, සංයුක්ත මණ්ඩලය යටතට පත්කරන ලදී. එහෙයින් 1966 නිමැවුම තුන්ගුණයකින් වැඩිවීමට හේතුවී ඇත්තේ, ඉහතින් වූ ලුණු දෙපාර්ත මේන්තුවේ නිමැවුමද, සංයුක්ත මණ්ඩලයේ නිමැවුමට ඇතුළත් කිරීම කරනකොට ගෙන සිදුවූ සංඛ්‍යාමය වැඩිවීමකි. 1967 දී ලුණු නිෂ්පාදනය ටොන්7 4,611 දක්වා, සියයට 17·5 කින් වැඩි වූයෙන්, ලුණු ලේවාවන්හි සාමාන්‍ය ධාරිතාවන් ඉක්මවිය. වඩා හොඳ කාලගුණයක් පැවතීම, මෙයට ප්‍රධාන හේතුව විය. මෙම නිමැවුම, ටොන් 78,000 වේ යැයි ඇස්තමේන්තු කොට ඇති ලංකාවේ මුළු වාර්ෂික අවශ්‍යතාවයට වඩා සුළු, වශයෙන්අඩුය. ලංකාවේ ලුණු නිෂ්පාදනය සංයුක්ත මණ්ඩලයේ ඒකාධිකාරයක් හෙයින්, අලෙවි කිරීමේ දුෂ්කරතාවන් කිසිවක් නොතිබුණි.

අලෙවි කරන ලද ප්‍රමාණය පසුගිය අවුරුදු පහ තුළදී සීඝ්‍රයෙන් වැඩිවූ අතර, ජාතික ලුණු සංස්ථාවේ ආදායමෙහි ද සීඝ්‍ර වැඩිවීමක් දක්වුනි. 1967 දී අලෙවි කරන ලද ප්‍රමාණය සහ අලෙවි යෙන් ලද ආදායම, ඉකුත් වර්ෂයේ මෙන් දෙගුණයක් විය. මේ නිසා, සංයුක්ත මණ්ඩලයේ ලාභය සියයට 65 කින් වැඩිවී, රුපියල් දස ලක්ෂ 2·0 ක් විය. මෙය ආයෝජිත ප්‍රාග්ධනයෙන් සියයට 26·4 ක් විය.

රජයේ ලුණු දෙපාර්තමේන්තුවේ වැඩ කටයුතු පවරා ගැනීමෙන් පසු, ලංකාවේ ලුණු කර්මාන්තයේ සංවර්ධනය සංවිධානය කිරීමට සංයුක්ත මණ්ඩලයට හැකි වී ඇත. සංයුක්ත මණ්ඩලය, 1967 දී ලංකාවේ ප්‍රධාන ලුණු ලේවා 4 ක් සංවර්ධනය කිරීමෙහි නිරත විය. එළිපන්විපාස්හි ලුණු ලේවාය පුළුල් කිරීමේ වැඩ 1965 දී ඇරඹුන අතර, 1970 දී එය නිම කිරීමට බලාපොරොත්තු වේ. වැය වේ යැයි ඇස්තමේන්තු කොට ඇති රුපියල් දශ ලක්ෂ 3·2 ක වියදමකින්, සාමාන්‍ය වාර්ෂික ධාරිතාව ටොන්

26,000 සිට 66,000 දක්වා වැඩිකිරීමට බලාපොරොත්තුවේ. 1965 දී සංවර්ධන කටයුතු ඇරඹුණු පාලවි ලුණු ලේවාය 1968 වනවිට නිමවනු ඇත. රුපියල් දශ ලක්ෂ 1·4 ක වියදමකින් ටොන් 4500 සිට 16000 දක්වා වාර්ෂික ධාරිතාව වැඩිකරනු ඇත. රුපියල් දශ ලක්ෂ 0·5 ක් වැය වන පුත්තලමේ ලේවාය සංවර්ධනය කිරීමේ කටයුතු 1965 දී ආරම්භ කොට ඇති අතර, 1969 වනවිට එය නිමවනු ඇත. මෙයින් එහි වාර්ෂික ධාරිතාව ටොන් 5300 සිට 9000 දක්වා වැඩිවනු ඇත. හම්බන්තොට අසල ලුණු ලේවා දෙකක් සංවර්ධනය කිරීමේ කටයුතු 1962 දී ආරම්භ කොට ඇති අතර, 1968 දී නිම වේ යැයි බලාපොරොත්තු වේ. රුපියල් දශ ලක්ෂ 2·5 ක් වැය වේ යැයි ඇස්තමේන්තු කොට ඇති මෙයින්, වාර්ෂික ධාරිතාව ටොන් 6100 සිට 22,000 දක්වා වැඩිවනු ඇත. වාර්ෂික ධාරිතාව ටොන් 1250 සිට 17,000 දක්වා වැඩිවන පරිදි, කුඩා ලුණු ලේවා දෙකක් පුළුල් කිරීමට ද සංයුක්ත මණ්ඩලය අදහස් කරයි. මේ අතර චාවකච්චේරියේ තැනීමට තීරණය කොට ඇති යන්ත්‍රෝපකරණ වලින් යුක්ත අලුත් ලුණු ලේවායේ වැඩ, 1970 දී ආරම්භ කිරීමට බලාපොරොත්තුවන අතර, 1974 දී නිමවනු ඇත. ඒ සඳහා රුපියල් දශ ලක්ෂ 25 ක් වැය වන අතර, වාර්ෂික ධාරිතාව ටොන් 115.000 ක් වනු ඇත.

**ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය**

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලය මගින් ලබාගන්නා ලද ඉල්මනයිට් ප්‍රමාණය 1967 දී සියයට 7·8 කින් (1966 දී 1965 දී පැවතියාට වඩා සියයට 5·7 කින් වැඩිවූ පසු) පහළ වැටී ටොන් 49115 ක් විය. මෙහි නිෂ්පාදනය කාලීන ස්වරූපයක් දක්වූ අතර, එය ඉල්මනයිට් වලට ඇති විදේශ ඉල්ලුම බලා ප්‍රවේශමෙන් සකස ගතයුත්තක් ද වේ. 1966 වර්ෂයේදී ධාරිතා ප්‍රමාණයෙන් සියයට 88 ක් නිපද වූ අතර, එම අනුපාතය, 1967 දී සියයට 70 දක්වා පහළ වැටුනි. කෙසේ වෙතත්, අලෙවි කළ ප්‍රමාණය ටොන් 5130 කින් නැතහොත්, සියයට 12·7 කින් සැලකිය යුතු ලෙස වැඩිවිනි.

ලංකා ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ නිමැවුම අඩුවුවද, අලෙවි කළ ප්‍රමාණය සියයට 37·5 කින් ඉහලගියේ එතෙක් තිබි තොගවලින්ද අලෙවිකොට ඇති හෙයිනි; මේ හේතුකොට ගෙන, අලෙවි කිරීමෙන් ලද ආදායම්, ප්‍රමාණයට අනුකූලව වැඩිවිනි. මෙය, 1967 දී ඉල්මනයිට් ටොන් 50,000 ක් අපනයනය කිරීමට ජපන් ව්‍යාපාර ආයතනයක් සමග ඇතිකරගත් කොන්ත්‍රාත්තුවක ප්‍රතිඵලයකි. ටොන් එකක සාමාන්‍ය මිල 1966 දී රු. 23·59 ක් වූ අතර, 1967 දී රුපියල් 27·31 දක්වා වැඩිවුනි. මෙයට ප්‍රධාන වශයෙන්ම හේතු වී ඇත්තේ වැඩි වැටුප් වියදම්ය. කොන්ත්‍රාත්තුවට ඇතුලත් වූ විකුණුම් මිල ටොන් එකකට රු. 26/-වුවද, රුපියල අවප්‍රමාණ කිරීමෙන් පසු, අනාගතයේදී ඊට වඩා වැඩි රුපියල්-මිලක් ලබාගැනීමට හැකිවනු ඇත. වැඩි වූ පිරිවැටුම හේතුකොට ගෙන සංයුක්ත මණ්ඩලයට වැඩි ලාභයක් ලැබුනි. ලාභය, ආයෝජිත ප්‍රාග්ධනයෙන් සියයට 2·5 ක් විය.

ඛනිජ වැලි සංයුක්ත මණ්ඩලයේ, පුළුල් කිරීමේ වැඩ පිළිවෙල යොමුකොට ඇත්තේ, නිෂ්පාදනය කරන ඉල්මනයිට් වලට වඩා වැඩි මිලක් ලබාගත හැකි රූටයිල් සහ සර්කොන් නමැති අළුත් නිෂ්පාදන නිපදවීම කෙරෙහිය. (ඉල්මනයිට්, රූටයිල් සහ සර්කොන් ටොන් එකක වෙළඳ මිල පිළිවෙලින් රුපියල් 26 ක් රුපියල් 500 ක් සහ රුපියල් 340කි.) එහෙයින්, රූටයිල් සහ සර්කොන් වෙන්කිරීමේ කම්හලක්, ත්‍රිකුණාමලයේ ඉදිකිරීමේ වැඩ 1967 දී ආරම්භකොට ඇති අතර, 1968 අප්‍රේල් මාසයේදී, එහි නිෂ්පාදනය ආරම්භ කිරීමට හැකිවනු ඇතැයි බලාපොරොත්තු වේ.

## ධීවර සංස්ථාව

1967 දී ධීවර සංස්ථාවේ නිමැවුම ඉකුත් වර්ෂයේදී ට වඩා සුළු වශයෙන් වැඩිවිනි. 1966 දී තිබූ ධීවර යාත්‍රා ගණන 6 ක්වූ අතර, 1967 දී මෙම ගණන නොවෙනස්ව පැවතුනද, 1966 දී 11 ක්වූ බෝට්ටු ගණන 1967 දී 25 දක්වා වැඩිවිනි. 1967 දී සංයුක්ත මණ්ඩලය විසින් කෙලවල්ලන් ඇල්ලීම සඳහා බෝට්ටු දෙකක්ද ඔවුන්ගේ යාත්‍රා කණ්ඩායමට එක්කරන ලදි. ධීවර යාත්‍රා වලින් ලද නිමැවුම රාත්තල් දශ ලක්ෂ 5.6 සිට 4·8 දක්වා අඩුවුනද, 1967 දි මුළු නිමැවුම වැඩිවී තිබුණි. ටොන් 11 යේ බෝට්ටු වලින් ලද නිමැවුම රාත්තල් දශ ලක්ෂ 0·15 සිට රාත්තල් දශ ලක්ෂ 0·83 දක්වා 1967 දී වැඩිවීමෙන් ද, ටොන් දශ ලක්ෂ 0·99 ක නිමැවුමක් කෙලවල්ලන් ඇල්ලීම සඳහා අළුතින් ලබාගත් බෝට්ටු වලින් ලැබීමෙන් ද, ධීවර යාත්‍රා වලින් ලද නිමැවුමෙහි අඩුවීම පමණටත් වඩා මකාලිය හැකිවිනි. සංයුක්ත මණ්ඩලයේ යාත්‍රා කණ්ඩායම විසින් අල්ලා ගන්නා ලද මසුන් ප්‍රමාණයට අතිරේකව, දේශීය ධීවරයින්ගෙන් ද තවදුරටත් මසුන් මිලට ගෙන ඇත. මෙම මිලට ගැනීම් 1966 දී රාත්තල් දශ ලක්ෂ 2·79 දක්වා වැඩිවිනි. දේශීය පෞද්ගලික නිෂ්පාදකයින් විසින් සාමාන්‍යයෙන් විකිණීම සඳහා ඉදිරිපත් කරණ මසුන් වඩා ජනප්‍රිය වර්ගයක් නොවූයෙන්, දේශීය නිෂ්පාදකයින්ගෙන් මිලට ගැනීම් මීට වඩා වැඩි කිරීමට හැකි නොවිනි. 1967 දී අලෙවි කිරීමට තිබූ මසුන් ප්‍රමාණයෙන් සියයට 69·4 ක් සංස්ථාව විසින් අලෙවි කොට ඇති අතර, ඉකුත් වර්ෂයේදී සංස්ථාව විසින් අලෙවි කොට ඇති ප්‍රමාණය සියයට 81·3 ක් විය. එහෙත් සංස්ථාව විසින් සපයනු ලබන්නේ දේශීය වෙළඳ පොලෙන් සියයට 5 ක් පමණකැයි ඇස්තමේන්තු කොට ඇත.

මාළු අලෙවි කිරීම් ඉකුත් වර්ෂයේදීට වඩා සියයට 7 කින් පිරිහුන ද, සංස්ථාවෙන් ලද් ආදායම 1967 දී සියයට 8 කින් වැඩිවී ඇත. (මැයි මාසයේ සිට සැප්තැම්බර් මාසය දක්වා කාලසීමාව තුලදී (පෞද්ගලික නිෂ්පාදකයින්ගෙන්, මිල වැඩි වර්ගවල මසුන් ලබාගැනීම සඳහා තරඟකාරි මිලක් ගෙවීම සඳහා) මසුන් විකිණීමේ මිල වැඩි කිරීමත්, ඉකුත් වර්ෂයට වඩා 1967 දී මිල වැඩි වර්ගවල මසුන් වැඩියෙන් අලෙවි කොට තිබීමත්, මෙයට කොටස් වශයෙන් හේතු වී ඇත. වියදම් ගැන සලකා බලන කල, අලෙවි කිරීම සහ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් වැඩි වැටුප් වියදම් දැරීමට සංස්ථාවට සිදුවිණි. ප්‍රමාණවත්වූ ප්‍රවාහන පහසුකම් නොමැති වූයෙන්, සංස්ථාවේ වැඩ කටයුතුද අඩු කිරීමට සිදුවිය. 1967 දී වූ මූල්‍ය අලාභය සම්පූර්ණ වශයෙන් රුපියල් දශ ලක්ෂ 2·0 ක් යැයි ඇස්තමේන්තු කොට ඇති අතර, එය යොදවන ලද ප්‍රාග් ධනයෙන් සියයට 10 ක් විය.

ධීවර සංස්ථාව කොළඹ (මෝදර) ගාල්ල, තංගල්ල, මිරිස්ස යන ස්ථානයන්හි පිහිටි ධීවර වරායවල් සංවර්ධනය කිරීමෙහිද නිරත විය. කොළඹ, ගාල්ල, සහ තංගල්ලෙහි ඉදිකිරීමේ වැඩ කෙරීගෙන යයි. මිරිස්සේ වරාය, සැලසුම් අවස්ථාවේ පවතී. සංස්ථාවට අයත් ධීවර නැව් කණ්ඩායම තරකිරීමටත්, පිටිපන සහ මන්නාරමේ, කිවුල් දියෙහි මාලු ඇල්ලීම දියුණු කිරීමටත්, සංස්ථාව බලාපොරොත්තු වෙයි.

## ලංකා පොහොර සංස්ථාව

අපනයනය කරන අමුද්‍රව්‍ය මිශ්‍ර කිරීමෙන් පොහොර නිෂ්පාදනය කිරීම ලංකා පොහොර සංස්ථාව විසින් තවදුරටත් කර ගෙන යන ලදී. මෙම කටයුත්ත සඳහා පෞද්ගලික කර්මාන්තශාලා වල ඇති මිශ්‍ර කිරීමේ පහසු කම් ප්‍රයෝජනයට ගන්නා ලදී. 1967 දී පසුගිය වර්ෂවලට වඩා විකුණුම් ප්‍රමාණය වැඩිවීම රජයේ කෘෂිකාර්මික සංවර්ධන වැඩ පිළිවෙල යටතේ වැඩි වූ අවශ්‍යතාවයන් පිළිබිඹු කරයි.

1967 දී ලංකා පොහොර සංස්ථාවේ කටයුතුවල පැවති ඉහළ මට්ටම, සැලකිය යුතු ලෙස වැඩිවූ, එහි ආදායම මගින් පිළිබිඹු වේ. මේ අනුව 1966/67 මුදල් වර්ෂයේ ලැබුණු ආදායම, 1966 යේ ආදායම මෙන් හතර ගුණයකට ආසන්න විය. මෙම ලාභ ප්‍රමාණය, යොදා ඇති ප්‍රාග්ධනයෙන් සියයට 18 ක් පමණ විය.

ලංකා පොහොර සංස්ථාව මගින් 1966 දී පටන් ගන්නා ලද දිස්ත්‍රික්ක පොහොර ගබඩා පිහිටුවීමේ වැඩ පිළිවෙලෙහි ප්‍රගතියක් පෙනුණි. 1967 දී ඉදි කරන ලද ගබඩාවල ධාරිතාව ටොන් 17, 000 ක් විය. අනාගතයේදී සංසථාව සඳහා පොහොර මිශ්‍ර කිරීමේ කම්හලක් පිහිටුවීමට බලාපොරොත්තු වේ.

## රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාවේ පළමු වැනි වර්ෂයේ (එනම් 1966) නිමැවුම එහි ධාරිතාවට වඩා බොහෝ පහළ ප්‍රමාණයක්වූ නමුත්, 1967 දී නිමැවුමෙහි සමස්ත වැඩිවීමක් සටහන් විය. සැප්තැම්බර් මාසය වනතෙක්, කර්මාන්ත ශාලාවේ වැඩ කරන ලද්දේ, එක් මුරයක් පමණ නමුත්, ඔක්තෝබර් මාසයේ සිට දිනකට මුරතුනක් වැඩ කරන ලදී. නිෂ්පාදනයේදී යොදා ගත් කාණ්ඩායම් ක්‍රමය නැතිකර, අවිච්ඡින්නව වැඩ කිරීමෙන් අපතේ යන කාලය අඩු කිරීම මගින් නිෂ්පාදනය සුවිධානනය කරනු ලැබිණි. කෙසේ වුවද, සරනේරු උදළු, සහ පොරෝ හැර, අන් නිෂ්පාදන සම්බන්ධයෙන් වාර්ෂික නිෂ්පාදන ධාරිතා ප්‍රමාණයට අඩුවෙන් වැඩ කෙරිණ. සමහර උපකරණ කැඩීයාම හා හිඟකම මීට හේතුවිය. ලංකාවට අවශ්‍ය සරනේරු වලින් සියයට 25 ක් ද, උදළුවලින් සියයට 60 ක් ද, අගුලු කොකු, හා සනීපාරක්ෂක උපකරණ සම්බන්ධයෙන් අවශ්‍ය සම්පූර්ණ ප්‍රමාණය සංස්ථාව සැපයූ බව ඇස්තමේන්තු කරන ලදී.

1967 දී නිෂ්පාදනය වැඩිවීම හා සමජාතීය භාණ්ඩ ආනයනය සීමා කිරීම නිසා ලෝහභාණ්ඩ සංස්ථාවේ විකුණුම් ප්‍රමාණයේ වටිනාකම; ඉකුත්වර්ෂයේ මෙන් තුන් ගුණයට ආසන්න විය. ආනයනය කළ සමජාතීය භාණ්ඩවල මිළ පදනම් කොට 1967 වර්ෂයේ නිරණය කළ මිළ ගණන් 1967 දී සංශෝධනය කළේ නැත. මූලික වශයෙන් වැටුප් වියදම් වැඩිවීම නිසා වියදම්වල වැඩිවීමේ උපනතියක් දිස්විණි. මෙය සංස්ථාවේ ධාරිතාවට වඩා ඉතා අඩුවෙන් කටයුතු කළේය; යන අදහසට සම්බන්ධ අතර, සමහර විට ඉකුත් වර්ෂයට වඩා අලාභ අධික වීමට ද ආධාර වූවා විය හැකිය.

වියදම රුපියල් දශ ලක්ෂ 21·5 කට ඇස්තමේන්තු කළ, වාත්තු කරන යකඩ, තනන කම්හලක් ඉදි කිරීම සම්බන්ධ මූලික කටයුතු රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව මගින් අවසන් කරන ලදී. 1968 දී එහි කටයුතු අවසන්කොට නිෂ්පාදනය ආරම්භ කරනු ඇතැයි බලාපොරොත්තුවේ. මෙයින් 600 දෙනෙකුට රැකියා සැපයීමට හා වාර්ෂිකව රුපියල් දශ ලක්ෂ 3·0 ක විදේශීය විනිමයක් ඉතිරි කර ගත හැකි වේතැයි ඇස්තමේන්තු කර ඇත,

## ලංකා ටයර් සංස්ථාව

1967 මැයි මාසයේදී ලංකා ටයර් සංස්ථාව, නිෂ්පාදනය අරඹන ලදී. කම්හලෙහි සංවර්ධනයේ පියවර දෙකක් ඇත. දැනට සම්පූර්ණකර ඇති ප්‍රථම පියවර අනුව, ටයර් 2,50,000 ක් ද, ටියුබ් හා පතු 2,40,000 ක් ද වාර්ෂිකව නිපදවීමට ධාරිතාවක් එහි ඇත. දෙවන පියවරෙන් කෙරෙන පුළුල් කිරීමත් සමග ම, ධාරිතාව, ටයර් 3,60,000 කට සහ ටියුබ් 3,50,000 දක්වා වැඩි වේ. ශිල්පි ක්‍රම ක්‍රියාවලියේ සංකීර්ණත්වය හා පුහුණු ශ්‍රමයේ අවශ්‍යතාවය නිසා ක්‍රමානුකූලව

1967 දී ටයර් 50,000 සිට 1968 දී ටයර් 1,50,000 ක් පමණ තරමකින්, ධාරිතාව වැඩි කොට 1969 දී ප්‍රථම පියවර සම්පූර්ණ කිරීමට සංස්ථාව බලාපොරොත්තු වේ. මෙසේ 1967 දී ධාරිතාවෙහි, ඌන උපයෝගීතාවයක් දක්නට ඇත. කෙසේ වෙතත්, (II (අා) V.1) සංඛ්‍යා සටහනෙහි දක්වෙන පරිදි, 1967 මැයි සිට ජූලි දක්වා දිනකට වැඩ මුර දෙකක් ද, ජූලි සිට දෙසැම්බර් දක්වා දිනකට වැඩ මුර තුනක් ද, කිරීමෙන් සැලැසුම් කළ නිෂ්පාදන ප්‍රමාණය ඉක්මවීමට සංස්ථාව සමත් විය. ටයර් හා ටියුබ් ආනයනය කිරීම සීමා කිරීම නිසා ඇති වූ විශාල හිඟය මග හැරීමට මෙම ප්‍රතිපත්තිය යොදා ගැනීමට සිදු විය. ආරක්ෂිත වෙළෙඳ පොළෙහි විකුණුම් පිළිබඳව දුෂ්කරතාවයක් ඇති නොවීය. සංස්ථාව වැඩියෙන් පාවිච්චි වන ප්‍රමාණ හතරක ටයර් නිෂ්පාදනය කළ අතර, එම ප්‍රමාණය, එකී ටයර් සඳහා දේශීය වෙළෙඳ පොළෙන් සියයට 55 ක් පමණ වි. නිෂ්පාදිත වල තත්ත්වය ද ආනයනය කරන නිෂ්පාදන සමග සතුටුදායක ලෙස සැසඳිය හැකිය. අලෙවි ප්‍රමාණයේ අඩුවක් පෙන්වන්නේ, 1967 අවසාන භාගයේ විකිණීම ආරම්භ කළ හෙයිනි. විකුණුම් මිළ, නියම කරන ලද්දේ, ආනයනය කළ නිෂ්පාදිතවල මිළට බොහෝ දුරට සමාන වන ලෙසය. මිළ ප්‍රතිපත්තිය තවමත් නම්‍ය වන අතර, නිෂ්පාදනය සංවිධානාත්මක වූ විට එය සංශෝධනය කරන්නට ඉඩ ඇත. ආනයනය කරන ලද ටයර් හා ටියුබ් විවිධ මිළවලට විකුණන ලද අතර, සංස්ථාව මෙම මිළ පරාසයේ මැද මිළක් නියම කරන ලදී.

දේශීය ඉල්ලුමට සරිලන පරදි, ටයර් සංස්ථාවේ පළමු වැනි පියවර වන්නේ වාර්ෂිකව ටයර් 2,50,000 ක් හා ටියුබ් 2,40,000 ක් නිපදවීමය. දේශීය ඉල්ලුම, වැඩි වු වහොත් හෝ විදේශීය වෙළෙඳ පොලවල් සොයා ගත හැකි වුවහොත් සංස්ථාවේ ධාරිතාව දෙවැනි පියවරේදී, වාර්ෂිකව ටයර් 3,60,000 ක් හා ටියුබ් 3,500,000 ක් නිපදවීමට හැකි වන සේ පුළුල් කිරීමට බලාපොරොත්තු වේ. සංස්ථාව රබර් කර්මාන්ත ශාලාවක් පිහිටුවීමට ද සැලැසුම් කොට තිබේ.

**ලංකා වානේ සංස්ථාව**

ලංකා වානේ සංස්ථාව සිය සංවර්ධන සැලැස්මේ පළමුවන පියවර සම්පූර්ණ කරන ලදුව 1967 අප්‍රේල් මස නිෂ්පාදනය ආරම්භ කළේය. වානේ ඇඹරුම් මෝල සහ කම්බි නිපදවීමේ මෝලකින් යුක්ත වන කම්හලේ, වාර්ෂික ධාරිතාව, පිළිවෙලින් ඇඹරුම් නිෂ්පාදිත ටොන් 60,000 ක් හා කම්බි ටොන් 12,000 ක් (දිනකට වැඩ මුර දෙකකින්) යුක්ත වේ. ක්‍රමානුකූල ලෙස ගන්නා පියවර අනුව උපරිම ධාරිතා නිෂ්පාදන ප්‍රමාණය මුදුන් පත්කර ගැනීමට සංස්ථාව බලාපොරොත්තු වෙයි. මේ නිසා 1967 ධාරිතාවේ යම් ඌන උපයෝගිතාර ගැනීමක් තිබුණි. ආනයන සීමා කිරීම සමග විකුණුම් පිළිබඳ දුෂ්කරතාවයක් නොවූ අතර, දේශීය වෙළඳ පොළට අවශ්‍ය ප්‍රමාණයෙන් සියයට 40 ක්, මේ කම්හල මගින් සැපයීමට හැකිවේ යයි ඇස්තමේන්තු කර ඇත.

1967 නිෂ්පාදනය ක්‍රියාත්මක කළ මාස කිහිපය තුළ වානේ හා ටයර් සංස්ථාවල විකුණුම් අයභාරය පිළිවෙලින් රුපියල් දශ ලක්ෂ 8.8 ක් හා රුපියල් දශ ලක්ෂ 4·5 ක් විය. වානේ සංස්ථාවේ විකුණුම් වලින් අඩකට වැඩි ප්‍රමාණයක් කරන ලද්දේ, රාජ්‍ය හෝ පොදු ආයතන වලටය. මෙම කාලච්ඡේදය සඳහා ලැබුණු ලාභය තාවකාලික ඇස්තමේන්තු අනුව රුපියල් 10,000 ක් වන අතර, එය ආයෝජනය කළ ප්‍රාග්ධන ප්‍රමාණයෙන් සියයට 0·1 ක් පමණි. විකිණීම, මෙයට පසු ආරම්භ කරන ලද ටයර් සංස්ථාවේ, ලාභ ලැබීම හෝ පාඩු, තවම ඇස්තමේන්තු කළ හැකි තත්ත්වය නොමැති අතර, 1967 දී එහි ලාභ හා අලාභ සම්තම් කැපි යනු ඇතැයි අපේක්ෂා කරන ලදී.

රුපියල් දශ ලක්ෂ 5·2 ක් ඇස්තමේන්තු වියදමක් කොට වානේ වාත්තු කම්හලත්, පදනම් කම්හලත් සහ ග්ලැවනයිස් කම්හලත් ඉදි කිරීමට සංස්ථාව කටයුතු කොට ඇත. වාත්තු කම්හලේ වාත්තු යකඩ ටොන් 700 ක ධාරිතාවක් ඇති අතර, පදනම් කම්හලේ මුර දෙකක් වැඩ කල විට ටොන් 3800 ක ධාරිතාවක සම්පූර්ණ කල හැකි වේ. 1968 ඔක්තෝබර් මස මෙම කටයුත්ත නිම කිරීමට බලාපොරොත්තු වෙයි. මුල් යෝජනා ක්‍රම සැලසුමෙහි දෙවන පියවරේ වැඩ කටයුතු ද සංස්ථාව මගින් ආරම්භ කරන ලදී. දැනට අවසන් කර ඇති ප්‍රථම පියවර යටතේ, කෙරෙන කටයුතු ආනයන කරනු ලබන වානේ කඳන් හා කම්බි ඇඹරීමට සීමාවේ. රුපියල් දශලක්ෂ 45·7 ක වියදමක් වේ යයි ඇස්තමේන්තු කර ඇති, දෙවැනි පියවර අනුව සංස්ථාව, ආනයන කරන යකඩ හා දේශීය යකඩ සුන්බුන් වලින් තමන්ගේම වානේ නිෂ්පාදනය කර ඇත. 1969 අවසානයේදී මෙහි වැඩ කටයුතු අවසන් කිරීමට බලාපොරොත්තු වෙයි.

**රාජ්‍ය පිටි ඇඹරුම් සංස්ථාව.**

රාජ්‍ය පිටි ඇඹරුම් කිරීමේ සංස්ථාව පිහිටුවනු ලැබුවේ 1964 දී වූ අතර, එහි කාර්යයන් වූයේ ආනයනය කරන ලද තිරිඟු සහ අනිකුත් ධාන්‍ය වර්ග වලින් වර්ෂයකට පිටි ටොන් 50,400 ක් ද, සත්ව ආහාර ටොන් 2,115 ක් ද, දහයියා ටොන් 16,215 ක් ද; නිපදවීමය. මෙය සමාජවාදී සෝවියට් සමූහාණ්ඩුව මගින් කොටස් වශයෙන් මුදල් කර ඇත. මෝලෙහි ඇස්තමේන්තු කරන ලද වියදම රුපියල් දශ ලක්ෂ 25·7 ක් වන අතර, 1967 අවසානය තෙක් ආයෝජනය වූ මුදල රුපියල් දශලක්ෂ 20·0 ක් විය. ප්‍රධාන ගොඩනැගිලි කටයුතු අවසන් කර ඇති අතර, මෝලෙහි නිෂ්පාදන කටයුතු 1968 මැද භාගයෙහි සිට ඇරඹීමට නියමිතය. සම්පූර්ණ නිෂ්පාදනයෙන් ඉතිරි කල හැකි වාර්ෂික විදේශ විනිමය ප්‍රමාණය, රුපියල් දශ ලක්ෂ 2 කැයි ඇස්තමේන්තු කර ඇත.

**රාජ්‍ය පොහොර නීතිගත සංස්ථාව.**

රාජ්‍ය පොහොර නීතිගත සංස්ථාව මගින් වාර්ෂිකව, ටොන් 307,000 ක් නිපදවිය හැකි කම්හලක් සපුගස්කන්දෙහි ගොඩනැංවීමේ සැලැස්මක් පිළියෙල කර ඇත. මෙහි වියදම රුපියල් දශ ලක්ෂ 190 ක් වෙතැයි ඇස්තමේන්තු කර ඇති අතර, මෙය ප්‍රධාන වශයෙන් සැපයුම් කරුවන්ගේ (ස. සෝ. සමු.) ණය මගින් මුදල් කෙරෙනු ඇත. පිහිටුවීමට යෝජනා වී ඇති ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙහි ඛනිජ තෙල් ශුද්ධ කිරීමේ කම්හල මගින් අමු ද්‍රව්‍ය සැපයෙනු ඇත. 1971 වන විට ගොඩනැගිලි කටයුතු අවසන් වෙතැයි අපේක්ෂා කරනු ලබන අතර, නිෂ්පාදනය ඉන්පසු ඇරඹෙනු ඇත. ප්‍රශස්ත නිෂ්පාදන තත්ත්වයේදී, කම්හල මගින් අටසියය දෙනෙකු සේවයෙහි යෙදවීමට සහ රුපියල් දශ ලක්ෂ 86 ක විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කිරීමට ඇස්තමේන්තු කර ඇත.

**ජාතික කිරි මණ්ඩලය.**

1965 ඔක්තෝබර් මාසයේදී ජාතික කිරි මණ්ඩලය මගින් පොළොන්නරුවෙහි කිරි උකු කිරීමේ කම්හලක් පිහිටුවීමේ කටයුතු ඇරඹීය. 1965 දී වැඩ අවසන් වූ අතර, 1968 මුල් කාලයේදී නිෂ්පාදනය ඇරඹෙනු ඇත වියදම වන රුපියල් දශ ලක්ෂ 6·5 න් රුපියල් දශ ලක්ෂ 1·3 ක ප්‍රමාණයක් නවසීලන්තයෙන් ආධාර වශයෙන් ලැබුණි. මුළු ධාරිතාව මගින්, උකු කල කිරි පින් (අවුන්ස 14 රේ) දශ ලක්ෂ 25 ක් නිෂ්පාදනය කරනු ඇත. වාර්ෂිකව 137 දෙනෙකු සේවයෙහි යෙදවීමට සහ රුපියල් දශ ලක්ෂ 3·2 ක විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කිරීමට ඇස්තමේන්තු කර ඇත.

**ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව.**

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව මගින් 1967 මාර්තුවේදී සපුගස්කන්දෙහි තෙල් ශුධ කිරීමේ කම්හලක් ගොඩනැංවීමේ කටයුතු ඇරඹිය. එහි වියදම රුපියල් දශ ලක්ෂ 150 ක් වෙතැයි ගණන් බලා ඇත. ඉතාලියේ ඊ. එන්.අ යි. කොන්ත්‍රාත්කරුවන් විසින් රුපියල් දශ ලක්ෂ 72 ක විදේශ විනිමය ණය වශයෙන් සැපයෙනු ඇත. ඉතිරිය, සංස්ථාව මගින් (රුපියල් දශ ලක්ෂ 415) සහ රජය මගින් (රුපියල් දශ ලක්ෂ 31·5) පියවනු ඇත. 1967 අවසානය දක්වා ආයෝජනය කළ ප්‍රමාණය රුපියල් දශ ලක්ෂ 9·4 ක් විය. මුළු කම්හල මගින් වාර්ෂිකව රසායනික ටොන් 137,000 ක් ද, ගැසලින් ටොන් 164,500 ක් ද, භූමිතෙල් ටොන් 250,000 ක් ද, ගුවන් යානා ඉන්ධන ටොන් 50,000 ක් ද, ස්වයංකාරි ගෑස් තෙල් ටොන් 220,000 ක් ද, කාර්මික ඩීසල් තෙල් ටොන් 140,000 ක් ද, කාර්මික උඳුන් තෙල් ටොන් 400,000 ක් ද, බිටියුමන් ටොන් 50,000 ක් ද සහ බංකර තෙල් ටොන් 180,000 ක් ද නිෂ්පාදනය කරනු ඇත. කම්හල මගින් වාර්ෂිකව 450 ක් පමණ පිරිසකට රැකියා සැපයීමට සහ රුපියල් දශ ලක්ෂ 26 සිට 35 දක්වා විදේශ විනිමය ප්‍රමාණයක් ඉතිරි කිරීමට ඇස්තමේන්තු කර ඇත.

**රාජ්‍ය ව්‍යාපාරයන්හි මිල කිරීමේ ප්‍රතිපත්තිය**

1965 දෙසැම්බර් මාසයේදී රාජ්‍ය සංස්ථා සහ රාජ්‍ය ව්‍යවසායන්හි මිල කිරීමේ ප්‍රතිපත්තීන් පිළිබඳව සොයා බැලීමට කමිටුවක් පත් කරනු ලැබිය. මෙම කමිටුව එහි වාර්තාව 1966 දෙසැම්බර් මාසයේදී පිළිගන්වන ලදී. පළමුවෙන්ම කමිටුව යෝජනා කළේ, රජය විසින් මිල කිරීම සම්බන්ධයෙන් පැහැදිලි ප්‍රතිපත්ති නියමයන් දක්විය යුතු බවය.

පහත සඳහන් කරනු ඉටු වේ යැයි සිතෙන පරිදි මිල තීරණය කළ යුතු යැයි කමිටුව යෝජනා කළාය:-

(අ) ප්‍රාග්ධනය හා ප්‍රාග්ධන සංචිත වෙනුවෙන් රජයේ ණය ගන්නා පොලී ප්‍රමාණයට වඩා අඩුම වශයෙන් සියයට 1 ක ප්‍රමාණයකින් යුතුව අවම ප්‍රමාණයක් (බදු ගෙවීමෙන් පසුව) අපසු ගෙවීමද සහ

(ආ) ප්‍රාග්ධන සංචිත වෙනුවෙන් ප්‍රමාණවත් වෙන් කිරීමක් කරන විට ව්‍යාපාරයේ ස්වාභාවය සැලකිල්ලට ගැනීම.

කමිටුවේ අදහස වූයේ මහජන ශුභ සිද්ධිය තකා, ඉහත සඳහන් ප්‍රතිපත්තිය අනුගමනය කිරීමට ඇමතිවරයා උනන්දු වූයේ නැති බවත්, එම කටයුතු භාර ඇමතිවරයා විසින් වෙනත් ක්‍රියා මාර්ගයක් ලියවිල්ලකින් ව්‍යවසාය වෙත යෝජනා කළ යුතු බවත්ය. එවිට ව්‍යවසාය එම යෝජනාව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූල්‍ය අවශ්‍යතා සඳහන් කිරීම අවශ්‍යය. පාඩුවක් සිදුවීම එහි ප්‍රතිඵලය නම් කටයුතු භාර ඇමති වරයා පාඩු වන මුදලට සමාන මුදලකින් ව්‍යාපාරයට පිහිටාධාරයක් අනුමත කරවා ගැනීමට පාර්ලිමේන්තුවේ අවසරය පැතිය යුතුය. දෙවනුව, ඉහත සඳහන් ප්‍රතිපත්ති නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා, අවශ්‍ය ව්‍යවස්ථාමය සැකැසීම් රජය මගින් සංවිධාන කළ යුතු යැයි නිර්දේශ කළාය. ආරම්භයේදී කමිටුවේ අදහස වූයේ, නියමිත ප්‍රාග්ධන ආයෝජන හා වත්කම්වල වටිනාකම් තීරණය කිරීම සඳහා, සෑම රාජ්‍ය සංස්ථාවකම ප්‍රාග්ධන ව්‍යුහය කාර්යක්ෂම කණ්ඩායමක් මගින් පරීක්ෂා කළ යුතු බවත්, රාජ්‍ය ව්‍යවසායයන්හි මූල්‍ය හා වෙනත් ප්‍රතිපත්ති ස්ථාවර පරීක්ෂණය යටතේ තැබීමට සහ රජයට උපදෙස් දීම සඳහා රජය මගින් විශේෂ අංශයක් පිහිටුවිය යුතු බවත්ය. තෙවනුව, පෞද්ගලික අංශයේ ව්‍යවසායයන් මගින් ගෙවනු ලබන සියළුම බදු, තීරු ගාස්තු හා වෙනත් මූල්‍ය අයවීම්, සියළු රාජ්‍ය ව්‍යවසායයන් විසින් ද ගෙවිය යුතු

යයි නිර්දේශ කළාය. සිව්වැනුව, රාජ්‍ය ව්‍යවසායවල ප්‍රාග්ධන සංචිත, භාණ්ඩාගාරයේ තැන්පත් කළ යුතු බවත්, සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ පූර්ව අනුමැතිය නොලබා කිසිම සංවර්ධන ව්‍යාපාරයක් ආරම්භ නොකළ යුතු බවත් කමිටුවේ අදහස විය.

ඉහත සඳහන් නිර්දේශය පරීක්‍ෂා කළ රජය, 1967 අප්‍රේල් මාසයේ දී, මිල කිරීම පිළිබඳව පැහැදිලි ප්‍රතිපත්ති උපදේශයන් නිකුත් කළ යුතු යයි තීරණය කළේය. රාජ්‍ය ව්‍යවසාය වල ක්‍රියා කලාපය පරීක්‍ෂා කිරීම සඳහා සැලසුම් සහ ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් අංශයක් පිහිටුවිය යුතු යයි ද තීරණය කළේය.

පෞද්ගලික ව්‍යවසායයන් ගෙවියයුතු බදු, තීරු බදු හා වෙනත් අයවීම් සියළු රාජ්‍ය ව්‍යවසායයන් ගෙවිය යුතු වීම, ප්‍රාග්ධන සංචිත භාණ්ඩාගාරයේ තැන්පත් කිරීම හා සැලසුම් ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ අනුමැතිය නොලබා කිසිම අයෝජනයක් නොකිරීම යන අදහස් වලට රජය එකඟ විය.

**සේවා නියුක්තිය**

පසුගිය අවුරුදු දෙකෙයි රාජ්‍ය කර්මාන්තයන්හි සේවා නියුක්තිය ගණ වසයෙන් පහත සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත:

**සංඛ්‍යා සටහන II (ආ) 8**

**සේවා නියුක්තිය — රාජ්‍ය කර්මාන්ත**

| සමායතන | විධායක | | ලිපිකාර විධායක නොවන | | කර්මාන්ත ශාලා කම්කරුවන් | | මුළු ගණන | |
|---|---|---|---|---|---|---|---|---|
| | 1966 | 1967 | 1966 | 1967 | 1966 | 1967 | 1966 | 1967 |
| 1. නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලාව .. | 32 | 32 | 207 | 217 | 924 | 969 | 1163 | 1218 |
| 2. ලංකා පිඟන් බඩු .. | 17 | 25 | 50 | 104 | 573 | 664 | 640 | 793 |
| 3. ලංකා තෙල් සහ මේද .. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. |
| 4. ලංකා තුනී ලෑලි .. | 10 | 12 | 42 | 48 | 935 | 906 | 987 | 966 |
| 5. ලංකා සම් භාණ්ඩ නිෂ්පාදන .. | 11 | 13 | 85 | 86 | 438 | 537 | 534 | 636 |
| 6. පරන්තන් රසායනික .. | 9 | 11 | 29 | 29 | 240 | 240 | 278 | 280 |
| 7. ලංකා සිමෙන්ති .. | 42 | 44 | 154 | 171 | 1136 | 1215 | 1332 | 1430 |
| 8. ශ්‍රී ලංකා සීනි .. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො | ල. නො. | ල. නො. |
| 9. ලංකා ඛනිජ වැලි .. | 5 | 6 | 20 | 39 | 112 | 170 | 137 | 215 |
| 10. ජාතික ලුණු .. | ල. නො. | ල. නො. | ල. නො | ල. නො | ල. නො. | ල. නො. | ල. නො | ල නො. |
| 11. ජාතික පේෂකර්ම .. | ල. නො. | ල. නො | ල. නො | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. |
| 12. ජාතික කුඩා කර්මාන්ත .. | 43 | 44 | 139 | 157 | 1448 | 1641 | 1630 | 1842 |
| 13. ලංකා වානේ .. | 29 | 37 | 49 | 64 | 518 | 706 | 596 | 807 |
| 14. ලංකා ටයර් .. | 19 | 19 | 73 | 89 | 668 | 683 | 760 | 791 |
| 15. රාජ්‍ය ලෝහ .. | 23 | 24 | 70 | 77 | 476 | 742 | 569 | 843 |
| 16. රාජ්‍ය පිටි ඇඹරුම් කම්හල .. | 2 | 9 | 8 | 19 | 15 | 34 | 25 | 62 |
| 17. ලංකා පොහොර .. | 10 | 12 | 78 | 107 | 21 | 37 | 109 | 156 |
| 18. ලංකා ධීවර .. | 75 | 89 | 566 | 862 | 186 | 411 | 827 | 1362 |
| 19. ලංකා පොහොර නිෂ්පාදන .. | — | | — | — | — | — | — | 11 |
| 20. ඛනිජ තෙල් සංස්ථාව | | — | | | | | | |
| (තෙල් පිරිපහදු) .. | — | — | — | — | — | — | — | 52 |
| 21. කිරි මණ්ඩලය (උකු කිරි) .. | — | — | — | — | — | — | — | 118 |
| එකතුව .. | **327** | **377** | **1570** | **2069** | **7690** | **8985** | **9587** | **11582** |

මූලය: සමායතන වලින් සැපැයූ වාර්තා වලින්

ල.නො. ලබාගැනීමට නොමැත.

## රාජ්‍ය කර්මාන්තවල වාර්ෂික ධාරිතාව,[1]

| සංයුක්ත මණ්ඩලය | නිපැවුම් ඒකකය | 1963 ධාරිතාව | 1963 නිමැවුම | 1963 විකුණුම | 1964 ධාරිතාව | 1964 නිමැවුම |
|---|---|---|---|---|---|---|
| 1. නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලාව | කඩදාසි – ටොන් | 6,600 | 5,340 | 7,752 | 6·600 | 6,451 |
| 2. ලංකා පිඟන් බඩු | පිඟන් බඩු – ටොන් | 380 | 770 | ල.නො. | 880 | 888 |
| (අ) මීගමුව | –එම– | (880) | (770) | ල.නො. | (880) | (888) |
| (ආ) පිළියන්දල | –එම– | — | — | — | — | — |
| (ඇ) කැඔලින් පිරිසිදු කිරීමේ කම්හල | කැඔලින් ටොන් | — | — | — | 5,000 | — |
| 3. ලංකා තෙල් සහ මේද | පොල් තෙල් ටොන් | 22,320 | 9,467 | ල.නො. | 22,320 | 1,961 |
| | සත්ව ආහාර ටොන් | 31,200 | 19,305 | ල.නො. | 31,200 | 21,565 |
| 4. ලංකා තුනී ලෑලි | තුනී ලෑලි සහ අඩි '000 | 18,000 | 13,558 | ල.නො. | 18,000 | 12,216 |
| | තේ පෙට්ටි '000 | (840) | (698) | (703) | (780) | (657) |
| | බැටන් '000 | (600) | ල.නො. | ල.නො. | (700) | ල.නො. |
| | බෝඩ්. ව. අ. '000 | (452) | ල.නො. | (656) | (993) | ල.නො. |
| | දොරවල් '000 | ( 6) | ල.නො. | ( 4) | ( 8) | ල.නො. |
| | වෙනත් නිෂ්පාදන '000 | — | . . . | . . . | ( 7) | ල.නො. |
| 5. ලංකා සම් භාණ්ඩ | ක්‍රෝම් - ව. අ. '000 | 544 | 500 | ල.නො. | 544 | 511 |
| | සපත්තු '000 | 216 | 163 | ල.නො. | 216 | 168 |
| | වෙනත් නිෂ්පාදන රාත්. '000 | 370 | 215 | ල.නො. | 370 | 216 |
| 6. පරන්තන් රසායන ද්‍රව්‍ය | කෝස්ටික් සෝඩා – ටොන් | 1,500 | 985 | 907 | 1,500 | 895 |
| | ක්ලෝරීන් ටොන් | 1,320 | 270 | 209 | 1,320 | 230 |
| | පිරිසිදු ලුණු කුඩු ටොන් | — | — | — | — | — |
| 7. ලංකා සිමෙන්ති | සිමෙන්ති ටොන් | 80,000 | 76,764 | 73,950 | 80·000 | 79,508 |
| (අ) කන්කසන්තුරේ | –එම– | (80,000) | (76,664) | (73,950) | (80,000) | (79,508) |
| (ආ) ගාල්ල | –එම– | — | — | — | — | — |
| 8. ශ්‍රී ලංකා සීනි | සීනි ටොන් | ල.නො. | 1,467 | ල.නො. | ල.නො, | 1,958 |
| | ස්ප්‍රීන්තු වර්ග ගැලුම් '000 | ල.නො. | — | ල.නො. | ල.නො. | — |
| 9. ලංකා ඛණිජ වැලි | ඉල්මනයිට් ටොන් | 40,000 | 22,401 | 18,786 | 50,000 | 45,503 |
| 10. ජාතික ලුණු | ලුණු – ටොන් | 20,000 | 4,300 | ල.නො, | 20,000 | 10,926 |
| 11. ජාතික පේෂ කර්ම | කපු නූල් – රාත්තල් '000 | 2,850 | 1,957 | ල.නො. | 2,850 | 2,185 |
| | රෙදිපිළි – යාර '000 | — | — | — | — | — |
| 12. ජාතික සුළු කර්මාන්ත | ගෘහ භාණ්ඩ–වටිනාකම (රු. '000) | ල.නො. | ල.නො. | 3,663 | 3,868 | ල.නො. |
| | උළු හා ගඩොල් (රු. '000) | — | — | — | — | — |
| | ඖෂධ (රු. '000) | — | — | — | — | — |
| 13. ලංකා වානේ | ඇඹුරුම් කොටස් - මෙට්‍රික් ටොන් | — | — | — | — | — |
| | කම්බි මෙට්‍රික් ටොන් | — | — | — | — | — |
| 14. ලංකා ටයර් | ටයර් ගණනින් | — | — | — | — | — |
| | ටියුබ් ගණනින් | — | — | — | — | — |
| | පතූ ගණනින් | — | — | — | — | — |
| 15. ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ | සරනේරු '000 | — | — | — | — | — |
| | අගුල් '000 | — | — | — | — | — |
| | උදළු හා පොරෝ '000 | — | — | — | — | — |
| | වෙනත් නිෂ්පාදන '000 | — | — | — | — | — |
| 16. ලංකා පෝර 5 | පෝර – ටොන් | — | — | — | — | — |
| 17. ලංකා ධීවර | මාළු – රාත්තල් '000 | — | — | — | — | — |
| | (අ) අල්ලාගත් මාළු | — | — | — | — | — |
| | (ආ) මිලට ගත් මාළු | — | — | — | — | — |
| | කරවල – රාත්තල් '000 | — | — | — | — | — |
| | මත්ස්‍ය ආහාර – රාත්. '000 | — | — | — | — | — |
| | අක්මා තෙල් – රාත්. '000 | — | — | — | — | — |

.. සැලකිය යුතු නොවේ. ල.නො. - ලබා ගැනීමට නොමැත.

1 කම්හල් ධාරිතාව දිනකට එක වැඩ මුරයකට වඩා විශේෂයෙන් තක්සේරු කළ අවස්ථාවල දී හැරෙන්නට දිනකට එක් වැඩ මුරයක දී තක්සේරු කළ වාර්ෂික ධාරිතාව

2 දැනට ලැබී ඇති වඩාත් සත්‍ය සංඛ්‍යා නිසා, මෙයට පෙර ප්‍රසිද්ධ කළ වාර්ෂික වාර්තාවල සමහර සංඛ්‍යා සංශෝධනය කොට ඇත.

## සංඛ්‍යා සටහන II (අ) 9

## නිපැයුම් හා විකුණුම් – 1963 – 67[2]

| | 1965 | | | 1966 | | | 1967 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| විකුණුම් | ධාරිතාව | නිමැවුම | විකුණුම් | ධාරිතාව | නිමැවුම | විකුණුම් | ධාරිතාව | නිමැවුම | විකුණුම් |
| 6,621 | 8,300 | 6,696 | 6,540 | 10,000 | 9,081 | 8,123 | 10,000 | 9,503 | 4,869 |
| ල.නො. | 880 | 863 | ල.නො. | 880 | 813 | ල.නො. | 3,340 | 1,956 | ල.නො. |
| ල.නො. | (880) | (863) | ල.නො. | (880) | (813) | ල.නො. | ( 940) | (918) | ල.නො. |
| — | — | — | — | — | — | — | (2,400) | (1,038) | ල.නො. |
| — | 5,000 | 1,630 | ල.නො. | 5,000 | 435 | ල.නො. | 5,000 | 2,027 | ල.නො. |
| ල.නො. | 22,320 | 1,514 | ල.නො. | 22,320 | 2,408 | ල.නො. | 22,320 | 1,280 | ල.නො. |
| ල.නො. | 31,200 | 22,158 | ල.නො. | 31,200 | 33,452 | ල.නො. | 31,200 | 43,206 | ල.නො. |
| ල.නො. | 18,000 | 13,969 | ල.නො. | 18,000 | 16,920 | ල.නො. | 25,000 | 15,801 | ල.නො. |
| (645) | ( 840) | (707) | (679) | (1,260) | ල.නො. | (934) | (1,300) | (888) | (859) |
| (385) | ( 710) | ල.නො. | (399) | ( 480) | ල.නො. | (397) | ( 750) | (227) | (441) |
| (610) | (1,550) | ල.නො. | (723) | (1,250) | ල.නො. | (581) | (2,400) | (1,670) | (538) |
| ( 6) | ( 10) | ල.නො. | ( 4) | ( 7) | ල.නො. | ( 3) | ( 9) | ( 10) | ( 9) |
| ( 2) | ( 28) | ල.නො. | ( 4) | ( 24) | ල.නො. | ( 15) | ( 38) | ( 22) | ( 20) |
| ල.නො. | 646 | 473 | ල.නො. | 600 | 617 | ල.නො. | 600 | 597 | ල.නො. |
| ල.නො. | 216 | 188 | ල.නො. | 216 | 224 | ල.නො. | 271 | 251 | 247 |
| ල.නො. | 286 | 200 | ල.නො. | 300 | 290 | ල.නො. | 300 | 328 | ල.නො. |
| 844 | 1,500 | 956 | 1,082 | 1,500 | 1,049 | 1,002 | 1,500 | 1,037 | 736 |
| 255 | 1,320 | 265 | 288 | 1,320 | 361 | 397 | 1,320 | 551 | 420 |
| — | — | — | — | — | 69 | ල.නො. | — | 117 | ල.නො. |
| 75,508 | 80,000 | 84,000 | 86,570 | 120.000 | 81,572 | 75,110 | 265,000 | 188,841 | 192,190 |
| (75,660) | (80,000) | (84,000) | (86,570) | (120,000) | (81,572) | (75,110) | (165,000) | (152,235) | (514,300) |
| — | — | — | — | — | — | — | (100.000) | ( 36,506) | (37,890)[3] |
| ල.නො. | ල.නො. | 3,273 | ල.නො. | ල.නො. | 2,553 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| ල.නො. | ල.නො. | — | ල.නො. | ල.නො. | 834 | ල.නො. | ල.නො. | ල.නො. | ල.නො. |
| 34,380 | 60,000 | 50,350 | 50,608 | 60,000 | 53,254 | 40,350 | 70,000 | 49,115 | 55,480 |
| 5,171 | 30,000 | 19,129 | 11,556 | 70,000 | 63,469 | 37,113 | 70,000 | 74,611 | 76,000 |
| ල.නො. | 3,863 | 2,412 | ල.නො. | 3,863 | 2,357 | ල.නො. | 3,863 | ල.නො. | ල.නො. |
| — | — | — | — | 5,000 | 2,810 | ල.නො. | 5,000 | ල.නො. | ල.නො. |
| 3,814 | 4,575 | 4,360 | 4,635 | 4,642 | 4,428 | 4,404 | 4,574 | 4,220 | 4,624 |
| — | 2,407 | 1,558 | 659 | 3,647 | 2,533 | 2,018 | 4,600 | 3,154 | 1,997 |
| — | — | — | — | 1,283 | 600 | 416 | 1,368 | 906 | 642 |
| — | — | — | — | — | — | — | 30,000 | 16,150 | 10,550 |
| — | — | — | — | — | — | — | 4,000 | 2,450 | 2,200 |
| — | — | — | — | — | — | — | 21,250[4] | 39,701 | 14,820 |
| — | — | — | — | — | — | — | 29,625[4] | 40,301 | 22,868 |
| — | — | — | — | — | — | — | 15,500[4] | 23,575 | 17,657 |
| — | — | — | — | 415 | 281 | 271 | 415 | 541 | 484 |
| — | — | — | — | 480 | 131 | 66 | 480 | 183 | 89 |
| — | — | — | — | 84 | 2 | 1 | 84 | 128 | 117 |
| — | — | — | — | 734 | — | — | 734 | 66 | 44 |
| — | — | 92,057 | 92,057 | — | 112,214 | 112,214 | — | 157,117 | 157,117 |
| — | — | — | — | — | 8,617 | 7,004 | — | 9,431 | 6,543 |
| — | — | — | — | — | (5,869) | — | — | (6,642) | — |
| — | — | — | — | — | (2,748) | — | — | (2,789) | — |
| — | — | — | — | — | 346 | 331 | — | 283 | 278 |
| — | — | — | — | 358 | 108 | 89 | 358 | 83 | 97 |
| — | — | — | — | 112 | 11 | 28 | 112 | 25 | 24 |

මූලය: සංස්ථාවන් විසින් සපයන ලද පිළිතුරු මාර්ගයෙනි.

3 නිෂ්පාදනය අත්හද බැලීමේ කාල සීමාවේ.දී නිපැවු සිමෙන්ති ද අඩංගුවේ.
4 1967 වර්ෂයේ සැලසුම් කළ නිෂ්පාදන ඉලක්කය.
5 මෙම සංස්ථාව විකිණීම සඳහා පෝර මිශ්‍ර කිරීම පමණක් කරයි.

## රාජ්‍ය කර්මාන්තවල විකුණුම්හි වටිනාකම, ලාභාලාභ

| සමායතන | විකුණුම්හි වටිනාකම | | | | |
|---|---|---|---|---|---|
| | 1963 | 1964 | 1965 | 1966 | 1967 |
| 1. නැගෙනහිර කඩදාසි කර්මාන්ත ශාලාව .. | 13,630 | 12,243 | 13,075 | 17,195 | 15,264 |
| 2. ලංකා පිඟන් බඩු .. .. | 2,558*5 | 2,932*5 | 3,348*5 | 4,421*5 | ල. නො. |
| (අ) මීගමුව .. .. .. | (2,558) | (2,658) | (3,058) | (3,219) | ල. නො. |
| (ආ) පිළියන්දල .. .. | — | — | — | (675) | ල. නො. |
| (ඇ) කැඹලින් .. .. | — | (274) | (290) | (527) | ල. නො. |
| 3. ලංකා තෙල් සහ මේද .. .. | ල. නො | ල. නො. | ල. නො. | ල. නො. | 18,373 |
| 4. ලංකා තුනී ලෑලි .. .. | ල. නො. | 4,658 | 5,129 | 6,352 | 6,816 |
| 5. ලංකා සම් භාණ්ඩ .. .. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | 5,449 |
| 6. පරන්තන් රසායන ද්‍රව්‍ය .. .. | 1,326*5 | 1,406*5 | 1,588*5 | 1,821*5 | 1,851 |
| 7. ලංකා සිමෙන්ති .. .. | 13,310 | 13,620 | 15,530 | 14,270 | 34,980 |
| (අ) කන්කසන්තුරේ – පරණ .. | (13,310) | (13,620) | (15,530) | (14,270) | — |
| (ආ) කන්කසන්තුරේ – අළුත් .. .. | — | — | — | — | (27,500) |
| (ඇ) ගාල්ල .. .. .. | — | — | — | — | ( 7,430) |
| (ඈ) පුත්තලම*4 .. .. | — | — | — | — | — |
| 8. ශ්‍රී ලංකා සීනි .. . .. | ල. නො. | ල. නො. | ල. නො | ල. නො. | ල. නො. |
| 9. ලංකා ඛනිජ වැලි .. .. | 488 | 894 | 1,316 | 1,049 | 1,443 |
| (අ) ඉල්මනයිට් කර්මාන්ත ශාලාව .. | (488) | (894) | (1,316) | (1,049) | ( 1,443) |
| (ආ) අනු–නිෂ්පාදිත කර්මාන්ත ශාලාව .. | — | — | — | — | — |
| 10. ජාතික ලුණු .. .. .. | ල. නො. | 465 | 1,040 | 3,340 | 6,840 |
| 11. ජාතික පේෂකර්ම .. .. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. |
| 12. ජාතික කුඩා කර්මාන්ත .. .. | 3,663 | 3,814 | 5,295 | 6,838 | 7,273 |
| (අ) ගෘහ භාණ්ඩ .. .. | (3,663) | (3,814) | (4,635) | (4,404) | ( 4,624) |
| (ආ) ගඩොල් සහ උළු ., .. | — | — | (660) | (2,018) | ( 1,997) |
| (ඇ) ආයුර්වේදීය ඖෂධ .. .. | — | — | — | (416) | ( 642) |
| 13. ලංකා වානේ .. .. .. | — | — | — | — | 8,800 |
| 14. ලංකා ටයර් .. .. .. | — | — | — | — | 4,460 |
| 15. ලංකා රාජ්‍ය ලෝහ | | | — | 358 | 1,804 |
| (අ) ලෝහ .. .. | — | — | | | |
| (ආ) උණු කළ යකඩ*4 .. .. | — | — | — | — | — |
| 16. ලංකා පොහොර .. .. | — | — | 32,901 | 41,363 | 58,673 |
| 17. ලංකා ධීවර .. .. .. | — | — | — | 9,946 | 10,746 |
| 18. රාජ්‍ය පිටි ඇඹරුම්*4 .. .. | — | — | — | — | — |
| 19. රාජ්‍ය පොහොර නිෂ්පාදන*4 .. .. | — | — | — | — | — |
| 20. ජාතික කිරි මණ්ඩලය – උකුකළ*4 .. | — | — | — | — | — |
| 21. ලංකා ඛනිජ තෙල් – පිරිපහදු*4 .. | — | — | — | — | — |

ල. නො. – ලබා ගැනීමට නොමැත.

*1 දැනට ලැබී ඇති විශ්වාස තොරතුරු නිසා පසුගිය වර්ෂයන්හිදී පළ කැරුන වාර්තාවන්හි සංඛ්‍යා සංශෝධනය කොට ඇත.

*2 බදු අය කිරීමට පෙරාතුව

**සංඛ්‍යා සටහන I (ආ) 10**

**සහ ආයෝජන - 1963/67*1**

රුපියල් දශ ලක්ෂ

| ලාභ (+) හෝ පාඩු (—)*2 | | | | | ආයෝජිත ප්‍රාග්ධන | |
|---|---|---|---|---|---|---|
| 1963 | 1964 | 1965 | 1966 | 1967 | 1966 | 1967 |
| + 82 | — 371 | + 1,463 | + 3,411 | + 3,200 | 19,924 | 22,113 |
| + 351 | + 503 | + 512 | + 623 | + 1,802*5 | 19,852 | 19,852 |
| (+ 351) | ල. නො. | ල. නො. | ල. නො. | (+ 743) | ( 5,000) | ( 5,000) |
| — | — | — | — | (+ 982) | (11,777) | ( 11,777) |
| — | ල. නො. | ල. නො. | ල. නො. | (+ 70) | ( 3,075) | ( 3,075) |
| ල. නො. | — 350 | ල. නො. | + 559 | | 7,898 | 7,454 |
| + 139 | + 268 | + 232 | + 420 | + 542 | 9,800 | 15,500 |
| + 443 | + 478 | + 257 | + 144 | + 272 | 5,639 | 6,220 |
| — 780 | — 730 | — 208 | + 190 | + 390 | 12,321 | 12,321 |
| + 6,045 | + 6,136 | + 4,940 | + 2,500 | +13,000 | 1,22,056 | 1,52,442 |
| (+ 6,045) | (+ 6,136) | (+ 4,940) | ( 2,500) | — | (19,873) | ල. නො. |
| — | — | — | — | ල. නො. | (46,420) | ( 48,272) |
| — | — | — | — | ල. නො. | (11,248) | ( 12,812) |
| — | — | — | — | — | (10,437) | ( 37,906) |
| — 3,400 | + 500 | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. | ල. නො. |
| — 626 | + 103 | — 309 | + 6 | + 369 | 7,402 | 14,495 |
| (— 626) | (+ 103) | (— 309) | (+ 6) | (+ 369) | ල. නො. | ( 11,337) |
| — | — | — | — | — | ල. නො. | ( 3,158) |
| ල. නො. | ල. නො. | + 548 | + 1,200 | + 1,982 | 7,250 | 7,500 |
| ල. නො. | + 1,500 | + 1,600 | + 1,400 | ල. නො. | 39,900 | |
| — 700 | — 690 | — 863 | — 800 | — 926 | 18,200 | 18,500 |
| (— 700) | (— 790) | (— 905) | (— 550) | (— 837) | | |
| — | — | (+ 37) | (— 350) | (— 364) | | |
| — | — | — | (+ 100) | (+ 275) | | |
| — | — | — | — | + 100 | 96,600 | 1,01,300 |
| — | — | — | — | ල. නො. | 58,731 | 67,396 |
| — | — | — | — 325 | — 388 | 18,737 | 23,175 |
| — | — | — | — | — | — | 3,655 |
| — | — | + 518 | + 450 | | 8,500 | 11,000 |
| — | — | — | ල. නො. | — 2,000 | 13,425 | 21,000 |
| — | — | — | — | — | 14,513 | 20,026 |
| — | — | — | — | — | 152 | 576 |
| — | — | — | — | — | 1,300 | 6,500 |
| — | — | — | — | — | 8,075 | 7,521 |

මූලය: සමායතන වලින් සැපැයූ වාර්තා වලින්.

*3 කාර්යකර ප්‍රාග්ධනය. රජය විසින් නියම වශයෙන් ම දයක වූ ප්‍රාග්ධනය සහ අනෙකුත් ප්‍රධානයන් සහ ණය මෙම සංඛ්‍යා වලින් දැක්වේ.

*4 නිෂ්පාදනයෙහි නොමැත.

*5 මූල්‍ය වර්ෂය අප්‍රේල් සිට මාර්තු.

නොරතුරු සපයා ඇති ආයතන 19 යේ සේවකයින් ගණන 11,582 ක් විය. ඉකුත් වර්ෂයට වඩා සේවකයින් සංඛ්‍යාව 1995 කින් හෙවත් සියයට 18 කින් ඉහළ ගොස් තිබුණි. ජාතික සුළු කර්මාන්ත සංස්ථාවේ වැඩිම සේවා නියුක්තියක් විය. මෙහි සේවකයින්ගෙන්ගෙන් වැඩි කොටසක් සිටියේ, දෙවෙනි ලෝක මහා සංග්‍රාම කාලයේ සිට පැවති වඩුකම් කොටසෙහි ය. යුද්ධ කාලයේදී සේවයෙහි යෙදුණු වඩු කාර්මිකයන්ට යුද්ධය අවසානයෙන් පසුව ද මෙම කටයුතු වල යෙදීමට ඉඩකඩ සැලසීම් වස්, රජය වඩු කාර්මික සංගම් පිහිටුවීමට තීරණය කළාය. මෙම සංගම් ලංකා වඩු කර්මාන්ත සංස්ථාව විශයෙන් සංවිධානය වී, පසුව ජාතික සුළු කර්මාන්ත සංස්ථාව වශයෙන් පුළුල් කෙරිණි. වඩු කාර්මිකයන් සේවයේ රඳවා ගැනීමේ ඇති අවශ්‍යතාවය නිසා වියදම් අඩුකර ගැනීම සඳහා යන්ත්‍ර භාවිතය සහ ශිල්පි ක්‍රම ඉදිරිපත් කිරීමට සංස්ථාවට හැක. සංස්ථාව මගින් විකිණීම් ප්‍රසාරණය කිරීමෙන් මෙම අවශ්‍යතාවය සපුරාලීමට හැකි වුවද, අඩු වියදමේ පෞද්ගලික ගෘහභාණ්ඩ නිෂ්පාදනකයින්ගේ බලවත් තරඟකාරිත්වත්වය හේතු කොට ගෙන, මෙය ද සීමා වේ.

අනෙක් ප්‍රධාන කර්මාන්ත හිමියන් වූයේ, ලංකා සිමෙන්ති, ලංකා ධීවර සහ නැගෙනහිර කඩදාසි සංස්ථාවන්ය. ඒ ශීඝ්‍ර ප්‍රසාරණ වැඩ පිළිවෙල නිසා සිමෙන්ති සංස්ථාවෙන් රැකිය සැපයිය හැකි ගණන විශාල වෙයි. එක්‍ර සේවා නියුක්ති පහසුකම් වඩාත් අධික වන ධීවර සංස්ථාව වෙතද, මේ ස්වරූප යේ අනාගත බලාපොරොත්තු වීම් ඇත. කෙසේ වෙතත් 1967 වර්ෂයේදී ධීවර සංස්ථාවේ ලිපිකරු සහ විධායක නොවූ වර්ගයේ සේවා නියුක්තියෙහි සැලකිය යුතු වැඩි වීමක් දක්නට තිබීම පැහැදිලි කරුණකි.